ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2016

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

තැ.පෙ.14, පේරාදෙණිය

# පටුන


1. හැඳින්වීම 03

2. 2016 වසරේදී ලැබූ ප්‍රගතිය 09

3. ආදායම 10

4. මූල්‍ය ප්‍රගතිය 12

5. 2016 දී උද්භිද උද්‍යානයන් හි සිදු වූ සංවර්ධන වැඩසටහන් හි ප්‍රගතිය 16

6. දෙපාර්තමේන්තුව යටතේ සෙසු ඒකකවල කළමනාකරණය 38

7. 2016 වර්ෂය තුළ සිදු කරන ලද බඳවා ගැනීම්, ස්ථාන මාරු, විශ්‍රාම ගැනීම් හා වෙනත් කටයුතු 40

8. කාර්ය මණ්ඩල පුහුණුව සහ හැකියාව ගොඩනැංවීම 42

9. 2017 වර්ෂය සඳහා අනාගත සැලැස්ම 43

# 1.හැඳින්වීම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, උද්භිද විද්‍යාත්මක කටයුතු සම්බන්ධව ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුරෝගාමී ආයතනය වේ. මෙය ශාක විතැන් සංරක්ෂණය, ශාක පිළිබඳ අධ්‍යයන කටයුතු, ශ්‍රී ලංකාවේ උද්‍යාන අලංකරණ විද්‍යාව ප්‍රවර්ධනය සඳහා පර්යේෂණාත්මක සහ තාක්ෂණික වැඩසටහන්, මල්වගා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විශාල දායකත්වයක් ලබාදෙන අතර දෙස් විදෙස් සංචාරකයින් ගේ ආකර්ශනීය ස්ථානයක් ද වේ.

ප්‍රධාන උද්භිද උද්‍යාන වන පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය (1821), හක්ගල උද්භිද උද්‍යානය (1861), ගම්පහ පිහිටි හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය (1876) සහ ගනේවත්ත වන ඖෂධ උද්‍යානයට අමතරව මෑත කාලයේදී පිළිවෙළින් 2013 සහ 2015 වර්ෂයන් හි හම්බන්තොට මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය සහ අවිස්සාවේල්ල සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය මහජනතාවට විවෘත කරන ලදී.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ නඩත්තු වන උද්භිද උද්‍යාන තුළ ශාක විශේෂ 4500 කට අධික ප්‍රමාණයක් සංරක්ෂණය වී ඇති අතර දුර්ලභ ශාක, වනාන්තර තුළින් වඳ වී ගොස් ඇති ශාක, ශ්‍රී ලංකාවට පමණක් ආවේණික ශාක, වඳ වීමේ තර්ජනයට ලක් වී ඇති ශාක විශේෂ රාශියක් මෙම සංරක්ෂිත ශාක අතරට ඇතුළත් ය. මෙම උද්භිද උද්‍යානවලට අමතරව ගනේවත්ත වන ඖෂධ උද්‍යානය ශ්‍රී ලංකාවේ ඖෂධ ශාක සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම පිණිස දායක වේ.

උද්භිද විද්‍යාත්මක සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් මෙන්ම ශාක පිළිබඳ විවිධ නිගමනයන් සහ සත්‍යබව තහවුරු කිරීමේ කාර්යයන් ද කරනු ලබන්නේ ජාතික ශාකාගාරයෙනි. මල්වගා සංවර්ධන සහ පර්යේෂණ අංශය විසින් මල්වගා පර්යේෂණ සහ විවිධ වැඩසටහන් මගින් මල්වගා සංවර්ධන කටයුතු සිදුකරමින් ඒ හරහා රට තුළ මල්වගා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සිදුකෙරේ. කෙටිකාලීන පුහුණු පාඨමාලා, එක් අවුරුදු සහ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවන් සහ අනෙකුත් අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් අධ්‍යාපන සහ පුහුණු මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලබයි.

මහජනතාවට විනෝදාස්වාදය ලබා දීම, ලොව පුරා ශාක වල විවිධත්වය සහ ශාක රාජධානියේ අලංකාරීත්වය රස විඳීමට ඉඩ ප්‍රස්ථා ලබා දීම, ශාක පිළිබඳ දැනුම ලබා දීම හරහා ශාක ප්‍රජාව වෙත ඔවුන් සමීප කරවීම ද ජාතික උද්භිද උද්‍යාන තුළින් සිදුවන මහඟු කාර්යයකි.

## 1.2 .දැක්ම

උද්භිද විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක කටයුතු උසස් මට්ටමකින් පවත්වාගනිමින් නිවර්තන කලාපීය හොඳම උද්භිද උද්‍යාන බවට පත් වීම.

## 1.3 මෙහෙවර

ස්වාභාවික සහ නිර්මිත පරිසරයන් තුළ ඇති ශාක සම්පත් අධ්‍යයනයට, තිරසාර සංරක්ෂණයට, අගය කිරීමට මහජනතාවට අවස්ථාව සලසා දෙමින් ඔවුන් ශාක වෙත සමීප කරවීම.

## 1.4. ප්‍රධාන කාර්යයන්

1. ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය කිරීමෙහිලා විතැන් සංරක්ෂණ ක්‍රමවේද සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.

2. අධ්‍යාපන හා සන්නිවේදන ක්‍රමවේද උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත් පිළිබඳව හා ශාක සම්පත් බැඳී පවත්නා විවිධ වූ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නා වූ නිවැරදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබා දීමට වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
3. ශ්‍රී ලංකාවේ මල්වගා කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ විවිධ පර්යේෂණ හා තාක්ෂණ ක්‍රමවේද අත් හදා බැලීම හා ක්‍රියාවට නැංවීම.
4. ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වා ගෙන යාම.
5. සුදුසු ස්ථානවල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍ය වන්නා වූ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම.
6. අලංකරණ උද්‍යාන විද්‍යාව ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම
7. ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඓතිහාසික වටිනාකමකින් යුත් වෘක්ෂලතා සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණ උපදෙස් ලබා දීම.
8. අනුරාධපුර ජයසිරි මහබෝධින් වහන්සේගේ සෞඛ්‍ය ආරක්ෂාව යහපත්ව පවත්වාගෙන යාම.

## 1.5 කාර්ය මණ්ඩල විස්තර

දෙපාර්තමේන්තුව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 785 ක් වන අතර, 2016.12.31 දින වන විට 648 දෙනෙකු සේවයේ යෙදී සිටි අතර ඒ පිළිබඳව සාරාංශයක් පහත දැක්වේ.

### 1.5.1 2016.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

| සේවක ගණය | වැටුප් ක්‍රමය | සේවය/ තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | SL – 3<br>SL- 1 | ශ්‍රී.ලං.වි.සේ<br>ශ්‍රී.ලං.පරි.සේ<br>ශ්‍රී.ලං.ගණ.සේ<br>ශ්‍රී.ලං.ඉං.සේ<br>ශ්‍රී.ලං.වා.වි.සේ | 33 | 14 |
| තෘතීය මට්ටම | MN – 7<br>MN – 6 | පරිපාලන නිලධාරි<br>ශ්‍රී.ලං.තා.සේ/විශේෂ ශ්‍රේණිය<br>භාෂා පරිවර්තක | 10 | 05 |
| ද්විතීය මට්ටම | MN – 4<br>MN – 3<br>MN – 2<br>MN – 1<br>MT – 1 | වැඩසටහන් සහකාර<br>කෘෂි මෙහෙයුම් නිලධාරි<br>සංවර්ධන නිලධාරි<br>කෘෂි උපදේශක<br>උද්‍යාන සංවර්ධන සහකාර<br>පර්යේෂණ සහකාර<br>ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර<br>කාර්මික නිලධාරි<br>(ශ්‍රී ලංකා තාක්ෂණ සේවය)<br>රාජ්‍ය කළමනාකරණ සේවය<br>ගාස්තු අයකිරීමේ සහකාර<br>තොරතුරු තාක්ෂණ සහකාර<br>උද්‍යාන වැඩමුලික | 186 | 135 |

| සේවක ගණය | වැටුප් ක්‍රමය | සේවය/ තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| ප්‍රාථමික මට්ටම | PL – 3<br>PL – 2<br>PL – 1 | ශිල්පීය<br>අර්ධ ශිල්පීය<br>ශිල්පීය නොවන | 556 | 494 |
| එකතුව | | | **785** | **648** |


### 1.5.2. දෙපාර්තමේන්තු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරියාගේ නම |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | කේ.එන්. යාපා මයා |
| අධ්‍යක්ෂ (සංවර්ධන) | එච්. සී. පී. ජයවීර මිය |
| අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ ප්‍රචාරණ) | ආචාර්ය ශෙලෝමි ඒ. ක්‍රිෂ්ණරාජා මෙනවිය |
| අධ්‍යක්ෂ (පාලන) | අයි.ඩබ්. එම්. සී. කේ.ඉලංගකෝන් මිය (අධ්‍යන කටයුතු සඳහා විදේශගත වී ඇත) |
| ප්‍රධාන ගණකාධිකාරි | ඩබ්. ටී. යූ. ද මැල් මයා |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | එන්.ටී. ලියනගේ මිය |
| සිවිල් ඉංජිනේරු | ඒ.එල්.එම්. මාහිර් මයා |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | වයි. එම්. වයි. යාපා බණ්ඩාර මයා |
| පරිපාලන නිලධාරි | එන්.ඩබ්.යූ.ආර්. ජයලත් මයා |

### 1.5.3. දෙපාර්තමේන්තුවේ සෙසු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරියාගේ නම |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය | ආචාර්ය.ඒ.එම්.ඒ.එස්. අත්තනායක මිය |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මල් වගා පර්යේෂණ) | එම්.එම්.ඩී.ජේ සේනාරත්න මයා |
| සහකාර අධ්‍යක්ෂ, ගම්පහ උද්භිද උද්‍යානය | එම්. සී. වික්‍රමසිංහ මිය |
| සහකාර අධ්‍යක්ෂ (නාරාහේන්පිට ස. අ. කාර්යාලය) | ආර්.එස්.ඩබ්. ගෝමස් මිය |
| පර්යේෂණ නිලධාරී /නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජාතික ශාකාගාරය) | ආර්.එස්.ඩබ්.රණසිංහ මිය |
| සහකාර අධ්‍යක්ෂ, සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය | පී. ඩී. එස්. විජේරත්න මයා |

## 1.6 සංවිධාන සැලැස්ම




*
රා.උ.උ. - රාජකීය උද්භිද උද්‍යානය
තෙ.ක.උ.උ. - තෙත් කලාපීය උද්භිද උද්‍යානය
වි.ක.උ.උ. - වියළි කලාපීය උද්භිද උද්‍යානය

**
නි.අධ්‍යක්ෂ - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අධ්‍යක්ෂ - සහකාර අධ්‍යක්ෂ

## 1.7 දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන සහ ඒකක

### පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

1821 දී ස්ථාපිත පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ පාරිසරික සංවර්ධනය සඳහා දායකත්වය ලබා දෙමින් ශාක පිළිබඳ අධ්‍යයනයට හා පැළෑටි සංරක්ෂණයට දායකත්වයක් ලබා දෙයි.

හෙක්ටයාර 61.25ක් වූ උද්‍යානය මහනුවර නගරය සමීපයෙහි පිහිටා ඇති අතර, ශාක අධ්‍යයනයට, උද්භිද හා පරිසර විද්‍යාත්මක පර්යේෂණයන්ට, උද්‍යාන බෝග වගා ප්‍රදර්ශනයට මෙන්ම විනෝදාස්වාදය ලබා දෙන ස්ථානයක් ලෙස ද ප්‍රචලිතය.

### ජාතික ශාකාගාරය

ජාතික ශාකාගාරය ශ්‍රී ලාංකාවේ දක්නට ලැබෙන ශාකවල වියළි ශාකාගාර නිදර්ශක එක් රැස් කර ඇති ස්ථානයකි. මෙහි වෙනත් බොහෝ විදේශික ශාක සහ අනෙකුත් වගා කරන ශාකවල නිදර්ශක ක්‍රමානුකූල අධ්‍යයනය සඳහා ආරක්ෂා ද කර ඇත. 160,000 ආසන්න ශාකාගාර නිදර්ශක යෝග්‍ය තත්ත්වයන් යටතේ සංරක්ෂණය කරමින් විමර්ශන කාර්යයන් සඳහා තබා ඇත. 3,500 පමණ ග්‍රන්ථ සහ සෙසු ශාක හා සම්බන්ධ වූ පොත් පත්, සඟරා ද ශාකාගාරයේදී ලබා ගත හැක.

ශාකාගාරයේ තැන්පත් කර ඇති නිදර්ශක ශාක වර්ගීකරණ, පර්යේෂණ සඳහා මෙන්ම ජෛව විවිධත්ව දත්ත බැංකුවක් ලෙස ශාක හඳුනා ගැනීමේ කාර්යයන් සඳහා ද යොදා ගනී.

### හක්ගල උද්භිද උද්‍යානය

හක්ගල උද්භිද උද්‍යානය වර්ෂ 1861 දි ආරම්භ කරන ලද අතර, උද්‍යානයට අයත් බොහෝ ශාක සෞම්‍ය කලාපීය ශාක වේ. මෙම ශාක එකතුව ශ්‍රී ලංකාවට ආවේණික ශාකවල මෙන්ම වෙනත් රටවලින් හඳුන්වාදුන් කඳුකර ශාක වල එකතුවකි. මේවා උද්‍යානයයේ විවිධ අංශවල ක්‍රමානුකූලව රෝපණය කර ඇත.

### හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය

ශ්‍රී ලංකාවේ රබර් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය 1876 දී ස්ථාපිත කරන ලදී. ඉතා පැරණි ඉතිහාසයක් ඇති එය උද්භිද විද්‍යාත්මකව හා උද්‍යාන විද්‍යාත්මක වශයෙන් ආකර්ෂණීය ස්ථානයකි. එය ගම්පහ පිහිටා ඇති අතර, වපසරිය හෙක්ටයාර 17.4 කි. ශ්‍රී ලංකාවේ සහ සෙසු රටවල ශාක විශේෂයන් 2000 ක පමණ සංකලනයකින් මෙම උද්‍යානය සමන්විත වේ.

### මල්වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය, පේරාදෙණිය

මල්වගා පර්යේෂණ සහ සංවර්ධන ඒකකය, මල්වගා සම්බන්ධ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සහ ශ්‍රී ලංකාවේ මල්වගා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා කැපවී සිටී.

වගාකරුවන් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර උපදේශන සේවා හා ආයෝජන අවස්ථා පිළිබඳව තොරතුරු සැපයීම, උපකරණ සහ තත්ත්වයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය ලබා දීම සඳහා ඒකකය ක්‍රියාකාරීව දායක වේ.

### ගනේවත්ත වන ඖෂධ උද්‍යානය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පිහිටා ඇත. උද්‍යානය හෙක්ටයාර 21.04 ක වපසරියකින් යුක්ත වන අතර, ඖෂධ පැළෑටි සංකලනය විශාල පරාසයක පැතිරී ඇත. ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පහසුවෙන් සොයා ගත නොහැකි දුර්ලභ ඖෂධීය පැළෑටි වර්ග සංරක්ෂණය කිරීම, ඖෂධ පැළෑටි ක්‍රමවත්ව වගා කිරීම සහ පැළෑටි එකතු කිරීමේ ක්‍රම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමෙහි නිරත වී සිටියි.

### මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය

දේශීය විශේෂඥයින් විසින් අවුරුදු 130 කට පසු සැලසුම් කොට බිහි වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම උද්භිද උද්‍යානය වනුයේ මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයයි. මෙම උද්‍යානය දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. සංවර්ධන වැඩ කටයුතු 2006 වර්ෂයේ ආරම්භ කෙරුණු අතර 2013 වර්ෂයේදී මහජනතාවට විවෘත කරන ලදී .

වියළි සහ ශුෂ්ක කලාපීය ශාකවල විතැන් සංරක්ෂණය සහ ප්‍රාදේශීය ආර්ථිකය සංවර්ධනයට දායකවීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වේ.

### සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය

අවිස්සාවේල්ල ප්‍රදේශය සමීපයෙහි මෙම උද්‍යානය පිහිටා ඇත. සංවර්ධන කටයුතු 2008 වසරේදී ආරම්භ කරන ලද අතර 2015 දී මහජනතාවට විවෘත කරන ලදී. උද්භිද උද්‍යානය හෙක්ටයාර 42.49 වපසරියකින් යුක්ත ය.

පහතරට තෙත් කලාපීය ශාකවල විතැන් සංරක්ෂණය කිරීම මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වී ඇත.

### සුවහස් මල් සෙවන, කොළඹ

දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි “ සුවහස් මල්” මල්වගා සංගම්වල මල්වගා නිෂ්පාදන අලෙවිය හා තාක්ෂණ ප්‍රචාරණ කටයුතු, දෙපාර්තමේන්තුවේ ඒකකයක් වන නාරාහේන්පිට පිහිටි “ සුවහස් මල් ” ඒකකයෙන් සිදු කරනු ලබයි.

### අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාස උද්‍යාන

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ, මහනුවර, නුවරඑළිය, අනුරාධපුරය පිහිටි නිල නිවාස උද්‍යාන සහ ගරු අගමැතිතුමාගේ කොළඹ සහ නුවරඑළිය ප්‍රදේශයේ පිහිටි නිල නිවාස උද්‍යාන නඩත්තු කටයුතු මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

### පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්

පළමු සහ දෙවන ලෝක යුද්ධ වලදී මිය ගිය පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ හමුදා සේවයට අයත් නිලධාරීන් සිහිවීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක මහනුවර, ජාවත්ත, බොරුල්ල සහ ත්‍රිකුණාමල ප්‍රදේශ වල පවත්වා ගෙන යයි. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මගින් යුධ සොහොන් ඒකක උද්‍යානවල කළමනාකරණ කටයුතු සිදු කරයි.

### හරිත පියස, මීගලෑව

වයඹ පළාතේ කුරුණෑගල සිට කි.මී. 96.56 දුරකින් මීගලෑව හරිත පියස පිහිටා ඇත. හරිත පියසෙහි වර්තමාන වපසරිය හෙක්ටයාර 2.43 කි. එය සංවර්ධනය වෙමින් පවතී. මල් වගාව පිළිබඳව අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට සහ දේශීය ජනතාවට පාඨමාලා පවත්වාගෙන යන හා ශාක ප්‍රචාරණය සිදුකරන මධ්‍යස්ථානයක් ලෙස ද ඉදිරියේදී කටයුතු කරනු ඇත.

# 2. 2016 වසරේදී ලැබූ ප්‍රගතිය


## 2.1 නරඹන්නන්ගේ පැමිණීම

2016 වසරේදී ද ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සියලුම ඒකක ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යන ලදී.


මෙම වසරේ උද්භිද උද්‍යාන නැරඹීම සඳහා පැමිණි මුළු සංචාරකයින් සංඛ්‍යාව 3,058,657 ක් වේ. මෙම සංචාරකයන්ගෙන් 2,593,252 ක් දේශිය සංචාරකයින් වන අතර 465,405 ක් විදේශීය සංචාරකයින් වේ.

2016 වසරේ උද්භිද උද්‍යාන කරා දේශීය සංචාරකයන් ගේ පැමිණීම පසුගිය අවුරුද්දට සාපේක්ෂව 17 % කි න්ද විදේශීය සංචාරකයන් ගේ පැමිණීම 14%කි න්ද ඉහළ ගොස් ඇත.

## 2.2. 2016 වර්ෂයේ පැමිණි නරඹන්නන්ගේ සංඛ්‍යාත්මක තොරතුරු




උද්‍යාන නැරඹීමට පැමිණි දේශීය හා විදේශීය සංචාරකයින් සංඛ්‍යාවන්




**2015 හා 2016 වසරවල දී උද්‍යාන නැරඹීමට පැමිණි දේශීය හා විදේශීය සංචාරකයින් සංඛ්‍යාවන් ගේ සංසන්දනාත්මක තොරතුරු**

## 2.3. 2012 වර්ෂයේ සිට 2016 තෙක් උද්භිද උද්‍යාන වෙත පැමිණි නරඹන්නන්ගේ තොරතුරු

| විස්තරය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
| දේශීය නරඹන්නන් සංඛ්‍යාව | 1,931,914 | 1,783,069 | 1,893,522 | 2,215,702 | 2,593,252 |
| විදේශීය නරඹන්නන් සංඛ්‍යාව | 259,545 | 293,454 | 345,468 | 407,553 | 465,405 |
| එකතුව | **2,191,459** | **2,076,523** | **2,238,990** | **2,623,255** | **3,058,657** |

## 2.4. 2016 දී උද්භිද උද්‍යාන වෙත පැමිණි නරඹන්නන්ගේ තොරතුරු

| නරඹන්නන්ගේ සංඛ්‍යාව | පේරාදෙණිය | හක්ගල | ගම්පහ | මිරිජ්ජවිල | සීතාවක | එකතුව |
|---|---|---|---|---|---|---|
| දේශීය වැඩිහිටි | 882,704 | 699,016 | 195,931 | 37,053 | 123,857 | 1,938,561 |
| දේශීය ළමුන් | 309,049 | 243,508 | 18,013 | 23,280 | 24,337 | 618,187 |
| ජ්‍යෙෂ්ඨ පුරවැසි | 14,480 | 14,291 | 887 | 2,158 | 4,688 | 36,504 |
| දේශීය නරඹන්නන්ගේ එකතුව | 1,206,233 | 956,815 | 214,831 | 62,491 | 152,882 | 2,593,252 |
| විදේශීය වැඩිහිටි | 407,031 | 25,505 | 335 | 109 | 131 | 433,111 |
| විදේශීය ළමුන් | 21,091 | 2,206 | 11 | 10 | 2 | 23,320 |
| විදේශීය සිසුන් | 7,455 | 1,481 | 19 | 19 | - | 8,974 |
| විදේශීය නරඹන්නන්ගේ එකතුව | 435,577 | 29,192 | 365 | 138 | 133 | 465,405 |
| නරඹන්නන්ගේ මුළු එකතුව | 1,641,810 | 986,007 | 215,196 | 162,629 | 153,015 | 3,058,657 |

# 3. ආදායම

2016 වර්ෂයේ ඇතුල්වීමේ ගාස්තු, පැළ අලෙවිය යනාදියෙන් උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ලබාගත් සම්පූර්ණ ආදායම රුපියල් මිලියන 784.4 කි (නරඹන්නන් ගෙන් රුපියල් මිලියන 709.7 ක් ද පැළ අලෙවියෙන් හා අනෙකුත් ක්‍රම හරහා රුපියල් මිලියන 74.7 ක් ද වශයෙනි). එය පසුගිය අවුරුද්දේ ඉහත කාල පරිච්ඡේදයට සාපේක්ෂව 36% ක වැඩිවීමකි.

## 3.1. 2012 වර්ෂයේ සිට 2016 දක්වා නරඹන්නන්ගේ පැමිණීමෙන් පමණක් ලැබුණු මුළු `ආදායම

| විස්තරය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
| දේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි) | 77.6 | 73.0 | 75.9 | 88.5 | 115.4 |
| විදේශීය නරඹන්නන් ගෙන් ලැබුණු ආදායම (රු.මි) | 279.0 | 314.9 | 369.8 | 435.1 | 594.3 |
| **එකතුව (රු.මි)** | **356.6** | **387.9** | **445.7** | **523.6** | **709.7** |

## 3.2. 2016 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මුළු ආදායම ඒකක වශයෙන්

| ඒකකය | මුළු ආදායම (රු) |
|---|---|
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය | 642,796,438.28 |
| හක්ගල උද්භිද උද්‍යානය | 90,409,862.61 |
| ගම්පහ උද්භිද උද්‍යානය | 23,844,169.00 |
| ගනේවත්ත ඖෂධ උද්‍යානය | 1,189,193.70 |
| මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය , හම්බන්තොට | 6,677,339.10 |
| සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල | 19,184,166.00 |
| සුවහස් මල් සෙවන පැළ තවාන, නාරාහේන්පිට | 170,305.00 |
| මීගලෑව හරිත පියස | 115,925.00 |
| **එකතුව** | **784,387,398.69** |

## 4. මූල්‍ය ප්‍රගතිය

ප්‍රධාන උද්‍යානයන් හි සහ අනෙකුත් ඒකකවල සංවර්ධන කටයුතු සැලසුම් කළ පරිදි සිදුකළ අතර 2016 වර්ෂයේ දී දෙපාර්තමේන්තුවේ මූල්‍යමය ප්‍රගතිය 99.6.% ක් විය. 2016 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රු.මි.784.4 ක් වූ අතර මුළු වියදම රු.මි. 649.5 ක් විය. ඒ අනුව 2016 වර්ෂයේ දී දෙපාර්තමේන්තුවේ මුළු වියදම එහි මුළු ආදායම ඉක්මනොවූ අතර රු.මි. 134.9 ක මුදල් අතිරික්තයක් (ලාභයක්) පෙන්වීය.

### 4.1. 2016 වසරේ වැය විස්තරය

| විස්තරය | මුළු ප්‍රතිපාදන (රු.මි) | මුළු වැය (රු. මි) | % |
|---|---|---|---|
| ප්‍රාග්ධන මූල්‍ය වෙන්වීම් | 302.800 | 300.877 | 99.4 |
| පුනරාවර්තන මූල්‍ය වෙන්වීම් | 349.515 | 348.744 | 99.8 |
| **එකතුව** | **652.315** | **649.621** | **99.6** |

### 4.2. පුනරාවර්තන වැය

| වැය විෂය | අයිතමය/ විස්තරය | 2016 ප්‍රතිපාදන (රු.) | 2016 ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) (රු.) | ඉතිරි ප්‍රතිපාදන (රු.) | මුළු වියදම ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|
| | **පුද්ගල පඩිනඩි** | **294,060,000.00** | **293,862,206.58** | **197,793.42** | **100** |
| 1001 | වැටුප් සහ වේතන | 132,166,000.00 | 131,968,945.13 | 197,054.87 | 100 |
| 1002 | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 5,450,000.00 | 5,449,323.26 | 676.74 | 100 |
| 1003 | වෙනත් දීමනා | 15,6444,000.00 | 15,6443,939.19 | 61.81 | 100 |
| | **ගමන් වියදම්** | **1,800,000.00** | **1,798,704.71** | **1295.29** | **100** |
| 1101 | දේශීය | 1,435,000.00 | 1,433,825.66 | 1,174.34 | 100 |
| 1102 | විදේශීය | 365,000.00 | 364,879.05 | 120.95 | 100 |
| | **සැපයීම්** | **8,821,530.00** | **8,377,927.18** | **443,602.82** | **95** |
| 1201 | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 700,000.00 | 699,515.78 | 484.22 | 100 |
| 1202 | ඉන්ධන | 3,280,25.00 | 2,841,634.15 | 438,990.85 | 87 |

| වැය විෂය | අයිතමය/ විස්තරය | 2016 ප්‍රතිපාදන (රු.) | 2016 ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) (රු.) | ඉතිරි ප්‍රතිපාදන (රු.) | මුළු වියදම ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 250,000.00 | 249,517.00 | 483.00 | 100 |
| 1205 | වෙනත් | 4,590,905.00 | 4,587,260.25 | 3,644.75 | 100 |
| | **නඩත්තු වියදම්** | **2,850.000.00** | **2,848,652.55** | **1,347.45** | **100** |
| 1301 | වාහන | 2,000,000.00 | 1,999,432.65 | 567.35 | 100 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 550,000.00 | 549,248.60 | 751.40 | 100 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 300,000.00 | 299,971.30 | 28.70 | 100 |
| | **සේවා** | **40,531,810.00** | **40,424,672.18** | **107,137.82** | **100** |
| 1401 | ප්‍රවාහන | 1,000,000.00 | 896,922.00 | 103,078.00 | 90 |
| 1402 | තැපැල් සහ සංනිවේදන | 2,354,750.00 | 2,353,821.32 | 928.68 | 100 |
| 1403 | විදුලිය සහ ජලය | 6,159,830.00 | 6,159,828.60 | 1.40 | 100 |
| 1404 | බදු කුළී සහ පළාත් පාලන ආයතන බදු | 150,000.00 | 148,584.00 | 1,416.00 | 99 |
| 1405 | වෙනත් | 30,867,230.00 | 30,865,516.26 | 1,713.74 | 100 |
| | **මාරුකිරීම්** | **1,452,569.00** | 1,431,869.49 | **20,699.51** | **99** |
| 1506 | දේපළ ණය පොළී | 1,452,569.00 | 1,431,869.49 | 20,699.51 | 99 |
| | **එකතුව** | **349,515,909.00** | **348,744,032.69** | **771,876.31** | **100** |

## 4.3. මූලධන වැය

| උප ව්‍යාපෘතිය | වැය විෂය | අයිතමය/ විස්තරය | 2016 ප්‍රතිපාදන (රු.) | 2016 ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) (රු.) | ඉතිරි ප්‍රතිපාදන (රු. ) | මුළු වියදම ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම** | **4,100,000.00** | **4,087,224.08** | **12,775.92** | **100** |
| 0 | 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 3,000,000.00 | 2,997,976.71 | 2,023.29 | 100 |

| උප ව්‍යාපෘතිය | වැය විෂය | අයිතමය/ විස්තරය | 2016 ප්‍රතිපාදන (රු.) | 2016 ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) (රු.) | ඉතිරි ප්‍රතිපාදන (රු. ) | මුළු වියදම ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| 0 | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 600,000.00 | 591,313.37 | 8,686.63 | 99 |
| 0 | 2003 | වාහන | 500,000.00 | 497,934.00 | 2,066.00 | 100 |
| | | **මුලධන වත්කම් අත්පත් කර ගැනීම** | **3,500,000.00** | **3,484,924.44** | **15,075.56** | **100** |
| 0 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 500,000.00 | 498,555.00 | 1,445.00 | 100 |
| 0 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000.00 | 487,291.24 | 12,708.76 | 97 |
| 0 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2,500,000.00 | 2,499,078.20 | 921.80 | 100 |
| 0 | 2201 | ප්‍රාග්ධන මාරුකිරීම් රාජ්‍ය ආයතන (භාර අරමුදල) [1] | 140,000,000.00 | 139,952,313.95 | 47,686.05 | 100 |
| 0 | 2401 | හැකියා වර්ධනය හා කාර්ය මණ්ඩල | 200,000.00 | 191,185.00 | 8,815.00 | 96 |
| | | **විශේෂ ව්‍යාපෘති** | | | | |
| | | **ගම්පහ උද්භිද උද්‍යානය හා ගනේවත්ත ඖෂධ උද්‍යානය සංවර්ධන** | **26,500,000.00** | **24,917,994.91** | **1,582,005.09** | **94** |
| 1 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 500,000.00 | 495,330.00 | 4,670.00 | 99 |
| 1 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,000,000.00 | 1,980,939.51 | 19,060.49 | 99 |
| 1 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 12,900,000.00 | 11,345,633.65 | 1,554,366.35 | 88 |
| 1 | 2105 | ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම | 11,100,000.00 | 11,096,091.75 | 3,908.25 | 100 |
| | | **වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට** | **98,500,000.00** | **98,365,401.78** | **134,598.22** | **100** |

[1] 2016 වසර සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල සඳහා මහා භාණ්ඩාගාරයෙන් වෙන් වූ මුදල රු.මි. 125 කි. එය උද්‍යාන වල සංවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් රු.මි. 125 ට අමතරව තවත් රු.මිලියන 15 ක් භාර අරමුදලින් වියදම් කිරීම සඳහා (තැන්පත් ගිණුමෙන්) 2016.05.11 දින පැවති 2016 වසරේ දෙවන භාරකාර මණ්ඩල රැස්වීමේදී අනුමත කර ඇත. ඒ අනුව 2016 වසර සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල සඳහා මුළු ප්‍රතිපාදන රු.මි.140 ක් විය.

| උප ව්‍යාපෘතිය | වැය ශීර්ෂය | අයිතමය/ විස්තරය | 2016 ප්‍රතිපාදන (රු.) | 2016 ශුද්ධ වියදම (අධිභාර හර කිරීමෙන් පසු) (රු.) | ඉතිරි ප්‍රතිපාදන (රු. ) | මුළු වියදම ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| 3 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 1,000,000.00 | 966,423.75 | 33,576.25 | 97 |
| 3 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 19,000,000.00 | 18,966,612.61 | 33,387.39 | 100 |
| 3 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 44,000,000.00 | 43,945,509.26 | 54,490.74 | 100 |
| 3 | 2105 | ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම | 34,500,000.00 | 34,486,856.16 | 13,143.84 | 100 |
| | | **තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල** | **25,000,000.00** | **24,881,144.52** | **118,855.48** | **100** |
| 4 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 300,000.00 | 299,970.00 | 30.00 | 100 |
| 4 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,000,000.00 | 997,319.35 | 2,680.65 | 100 |
| 4 | 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 8,550,000.00 | 8,434,452.66 | 115,547.34 | 99 |
| 4 | 2105 | ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම | 15,150,000.00 | 15,149,402.51 | 597.49 | 100 |
| 7 | 2105 | මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය | **5,000,000.00** | **4,996,364.70** | **3,635.30** | **99** |
| | | එකතුව | **302,800,000.00** | **300,876,553.38** | **1,923,446.62** | **99** |

## 4.4. දෙපාර්තමේන්තුවට 2016 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන හා වියදම (ඒකක/උද්‍යාන වශයෙන්)

| වැඩසටහන | **2016 දී වෙන් වූ රජයේ ඒකාබද්ධ ප්‍රතිපාදන (රු.මි.)** | **2016 වියදම (රු.මි.)** | **2016 දී උද්භිද උද්‍යාන අරමුදලින් වෙන් වූ ප්‍රතිපාදන (රු.මි.)** | **2016 උද්භිද උද්‍යාන අරමුදලින් වියදම් වූ මුදල (රු.මි.)** | **මුළු වියදම (රු.මි.)** |
|---|---|---|---|---|---|
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 7.175 | 7.141 | 46 | 45.875 | 53.016 |
| ගම්පහ උද්භිද උද්‍යානය සංවර්ධනය | 15.550 | 14.170 | 3 | 3.161 | 17.331 |

| වැඩසටහන | 2016 දී වෙන් වූ රජයේ ඒකාබද්ධ ප්‍රතිපාදන (රු.මි.) | 2016 වියදම (රු.මි.) | 2016 දී උද්භිද උද්‍යාන අරමුදලින් වෙන් වූ ප්‍රතිපාදන (රු.මි.) | 2016 උද්භිද උද්‍යාන අරමුදලින් වියදම් වූ මුදල (රු.මි.) | මුළු වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|
| හක්ගල උද්භිද උද්‍යානය සංවර්ධනය | 0.425 | 0.426 | 32 | 32.348 | 32.774 |
| ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය | 10.950 | 10.748 | 3 | 3.011 | 13.759 |
| මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය | 5.0 | 4.996 | 0.0 | 0.0 | 4.996 |
| අධ්‍යාපන සහ පුහුණු | 0.2 | 0.191 | 1.0 | 0.914 | 1.105 |
| ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ | 0.0 | 0.0 | 5 | 4.714 | 4.714 |
| ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන | 0.0 | 0.0 | 23 | 23.336 | 23.336 |
| සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල | 25.0 | 24.881 | 5 | 4.799 | 29.680 |
| මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට | 98.50 | 98.365 | 2 | 1.892 | 100.257 |
| ප්‍රධාන කාර්යාලයේ වැඩිදියුණු කිරීම් කටයුතු | 0.0 | 0.0 | 20 | 19.904 | 19.904 |
| එකතුව | **162.8** | **160.918** | **140** | **139.954** | **300.872** |

## 5. 2016 වර්ෂයේ උද්භිද උද්‍යානයන් හි සිදු වූ සංවර්ධන වැඩසටහන් හි ප්‍රගතිය

සියලුම උද්‍යානයන් හි භූමි අලංකරණය කටයුතු නිසි පරිදි සිදුකිරීම තුළින් ද නව සංවර්ධිත ප්‍රදේශ, අඩිපාරවල්, වීදි, උද්‍යාන කාර්යක්ෂමව නඩත්තු කිරීම තුළින්ද උද්‍යානයන් හි අලංකාරය හා තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

## 5.1 රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය

<u>මූල්‍ය ප්‍රගතිය</u>

| | |
|---|---|
| අනුමත ප්‍රතිපාදන | : ප්‍රාග්ධන දීමනා වලින් රු. මි.7.175.ක් සහ උද්‍යාන භාරකාර අරමුදල රු.මි.46 |
| වැය | : රු.මි. 53.016 |



මාර්ග සඳහා කාපට් අතුරා තත්ත්වය වැඩිදියුණු කර ඇති අයුරු

<u>භෞතික ප්‍රගතිය</u>

- ශාක සංරක්ෂණය අරමුණු කරගනිමින් මහජනතාවට නැරඹීමේ පහසුකම් ද සහිත සෙවන ලැදි ශාක සහ දුර්ලභ ශාක ප්‍රදර්ශනය සඳහා ශාක සංරක්ෂණාගාරයක් ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කර වැඩ අවසන් කරන ලදී. එහි පැළෑටි ස්ථාපිත කිරීමේ කටයුතු සහ අභ්‍යන්තර සැලසුම් නිර්මාණ කටයුතු සිදුවෙමින් පවතින අතර 2017 වර්ෂයේ දී මහජනතාවට විවෘත කිරීමට බලාපොරොත්තු වේ.



ස්ථාපිත ශාක සංරක්ෂණාගාරය

- උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග පද්ධති, බෝක්කු හා ජලාප්‍රවාහන පද්ධති වැඩි දියුණු කිරීම සිදුකරන ලද අතර ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම මගින් උද්‍යානයට නව පෙනුමක් ද ලබා දීමට කටයුතු කරන ලදී. උද්‍යානයේ නිලධාරීන්ගේ නිලනිවාස ද අලුත්වැඩියා කරන ලදී.

- උද්‍යානයේ ප්‍රධාන මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා කාපට් ඇතිරීම කරන ලදී.

- උද්‍යානයේ සංචාරක බංගලාවේ තත්ත්වය උසස් කිරීම සඳහා නවීන උපකරණ සහ ආම්පන්න සවි කරමින් නවීකරණය කර අලුත්වැඩියා කෙරිණි.

- “කැෆටේරියා” ආපනශාලාවේ වහල අලුත්වැඩියා කරමින් එහි තත්ත්වය ඉහළ නැංවීමේ කටයුතු සිදුකරන ලදී.



ඉදි කෙරුණු ගිම්හාන කුටියක්

- ප්‍රධාන ගේට්ටුවෙන් උද්‍යානයට නරඹන්නන් ඇතුළු වීමේ දී පවතින තදබදය අඩු කිරීමේ අරමුණින් ගන්නෝරුව පෙදෙසෙහි පිහිටි ප්‍රවේශපත්‍ර කවුළුව ද විවෘත කරන ලදී.
- උද්‍යානයේ ගිම්හාන කුටි 03 ක් අලුතින් ඉදිකරන ලදී.



අලුතින් විවෘත කරන ලද ගන්නෝරුව පෙදෙසෙහි පිහිටි ටිකට් කවුන්ටරය

- අලුතින් නිල නිවාසයක ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර එහි පළමු අදියරෙහි ඉදි කිරීම් කටයුතු නිමකර ඇති අතර දෙවන අදියරෙහි ඉදිකිරීම් කටයුතු 2017 වසරේ සිදු කර අවසන් කිරීමට බලාපොරොත්තු වේ.
- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 125,803 ක පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.



අලුතින් ඉදිවන නිල නිවස

- උද්‍යානයේ ශාක එකතුවට අදාල ශාක නාම පුවරු ද සවි කිරීම සිදුකරන ලද අතර විශේෂ ශාක පිළිබද සවිස්තරාත්මක පුවරු 100 ක් ස්ථාපිත කරන ලදී. තවද උද්‍යානය තුළ මාර්ග සංඥා පුවරු සවි කිරීමේ කටයුතු ද සිදු

කරන ලදී. උද්‍යානය තුළ දැකිය හැකි කුරුල්ලන් ඇතුළු අනෙකුත් වන සතුන් පිළිබඳ පුවරු 3ක් ස්ථාපනය කරන ලදී.



**අලුතින් ස්ථාපනය කරන ලද කුරුල්ලන් පිළිබඳ පුවරුවක්**

- උද්‍යානයේ ශාක අංශ 2 ක ප්‍රතිශෝධන කටයුතු සිදුකරන ලදී. කුරුල්ලන් සහ සමනලුන් වඩා ආකර්ෂණය වන ශාක එකතුන් උද්‍යානයේ ස්ථාපිත කිරීමට ද සැලසුම් සකස් කර කටයුතු සිදුකරමින් පවතී.
- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දිය හැකි තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඇතුළත් පත්‍රිකා, පුවරු සකස් කරන ලදී. පැමිණෙන නරඹන්නන්හට උද්‍යානය පිළිබඳ තොරතුරු ලබා දීමට උද්‍යානය තුළ සංචාරය සඳහා මඟපෙන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර වැඩසටහන් 79 ක් පවත්වා නරඹන්නන් 2,940 දෙනෙකු සඳහා එම සේවාව සපයා ඇත.



**ටජිකිස්තාන් ජනපති ඉමොමාලි රහමාන් මැතිතුමා උද්‍යානය නැරඹීමට පැමිණි අවස්ථාව**

- උද්‍යානයේ පැළවල ආරක්ෂාවට හා පරිපාලන කටයුතු කාර්යක්ෂම කර ගැනීම සඳහා CCTV කැමරා පද්ධතියක් උද්‍යානය තුළ ස්ථාපිත කරන ලදී.

මෙම වසරේ දී උද්‍යානය නැරඹීම සඳහා පැමිණි විදේශීය රාජ්‍ය අමුත්තන් 24 දෙනා අතර පකිස්ථාන් අග්‍රාමාත්‍ය අතිගරු මුහම්මද් නවාස් ෂෙරීෆ් මැතිතුමා, නවසීලන්ත අගමැති ජෝන් කී මැතිතුමා සහ ටජිකිස්තාන් ජනපති ඉමොමාලි රහමාන් මැතිතුමා විශේෂ රාජ්‍ය අමුත්තන් විය.

## 5.2 හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය, ගම්පහ

<u>මූල්‍ය ප්‍රගතිය</u>

| | |
|---|---|
| **අනුමත ප්‍රතිපාදන:** | **ප්‍රාග්ධන දීමනා වලින් රු. මි.15.55 ක් සහ උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 3** |
| **වැය** | **: රු.මි. 17.331** |



**අලුතින් ඉදිවන නිල නිවස**

<u>**භෞතික ප්‍රගතිය**</u>

- උද්‍යානයේ බාහිර පෙනුම වර්ධනය කිරීමේ අරමුණින් උද්‍යානයේ පිහිටි ගොඩනැගිලි, නිලනිවාස, පැළ ගෘහය, උද්‍යානය වටා තාප්පය, ගිම්හාන කුටි, සෙවන ගෘහය, බෝට්ටු අංගනයන් හි අලුත්වැඩියා කටයුතු සිදුකරන ලද අතර උද්‍යානයේ තත්ත්වය ඉහළ මට්ටමකට නගාසිටුවීම සඳහා භූමි සංවර්ධන කටයුතු සහ සෙසු නඩත්තු කටයුතු සිදු කරන ලදී.
- අලුතින් බෝට්ටු 03ක් උද්‍යානයේ ස්ථාපිත වැවෙ හි පැදීම සඳහා යොදවන ලදී.
- රථගාල ආශ්‍රිත පෙදෙස ඉන්ටර්ලොක් අතුරා පිළිසකර කිරීම් සිදුකරන ලදී.
- උද්‍යානයට නව පෙනුමක් ගෙනදීම සඳහා ප්‍රවේශ පත්‍ර කවුළුව සහ ඒ අසල ඇති මුර කුටි අලුත්වැඩියා කරන ලදී.



**ඕකිඩ් ශාක ගෘහයක ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින අයුරු**

- නරඹන්නන් ගේ භාවිතය සඳහා නව වැසිකිළි පද්ධතියක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර වැඩ අවසන් කර ඇත.
- දැනට පවතින කාර්ය මණ්ඩල නිල නිවාස වලට අමතරව අලුතින් නිල නිවාසයක් ඉදි කරන ලදී.

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 55,663 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී. උද්‍යානයේ ශාක එකතුවට අදාල ශාක නාම පුවරු ද සවි කිරීම සිදුකරන ලදී.



අලුතින් ඉදිවුනු නව වැසිකිළි පද්ධතිය

- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඇතුළත් පත්‍රිකා, පුවරු සකස් කරන ලදී.

- උද්‍යානයට පැමිණෙන නරඹන්නන් සඳහා පහසුකම් වර්ධනය සඳහා බංකු 25 ක් ස්ථාපිත කරන ලදී.

- උද්‍යානය වෙත නරඹන්නන් පැමිණෙන ප්‍රමාණය වර්ධනය කිරීමේ අරමුණින් මහජන ප්‍රදර්ශනය සඳහා ඕකිඩ් ශාක ගෘහයක් ඉදිකිරීම ආරම්භ කරන ලද අතර 20% ක වැඩ දැනට අවසන් වී ඇත. මේ සඳහා උපදේශන සේවා සහ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවයි.




මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමට සකසන බොන්සායි ගෘහය

- මීට අමතරව බොන්සායි ශාක එකතුවක් ද මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමට කටයුතු කරමින් පවතී.

## 5.3 හක්ගල උද්භිද උද්‍යානය

<u>මූල්‍ය ප්‍රගතිය</u>

| | |
|---|---|
| **අනුමත ප්‍රතිපාදන:** | **ප්‍රාග්ධන දීමනා වලින් රු. මි.0.425 ක් උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 32** |
| වැය | **: රු.මි.32.774** |



**කාර්යාල පරිශ්‍රයෙ හි විශාල කිරීම් කටයුතු සිදු කර ඇති අයුරු**

<u>භෞතික ප්‍රගතිය</u>

- උද්‍යානයේ බාහිර පෙනුම වර්ධනය කිරීමේ අරමුණින් උද්‍යානයේ පිහිටි ගොඩනැගිළි, නිලනිවාස, පැළ ගෘහ, ගිම්හාන කුටි, සංචාරක බංගලාවෙ හි තීන්ත ආලේප කර අලුත්වැඩියා කටයුතු සිදුකරන ලදී.
- දැනට භාවිතාවන කාර්යාල පරිශ්‍රය තුල කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති බැවින් කාර්යාල පරිශ්‍රයෙහි විශාල කිරීම් කටයුතු අවසන් කර ඇත.



**නව ඇතුලුවීමේ සංකීර්ණය**

- දැනට පවතින ඇතුල්වීමේ කවුළුව ඉතා පැරණි එකක් වන අතර එය ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට පැමිණෙන නරඹන්නන් සඳහා ඉඩ පහසුකම් අඩු ස්ථානයක් බැවින් නව ඇතුළුවීමේ සංකීර්ණයක් ස්ථාපිත කරන ලදී. 2017 වසරේ දී එය නරඹන්නන් සඳහා විවෘත කිරීමට නියමිතය.
- දැනට පවතින කාර්ය මණ්ඩල නිල නිවාස වලට අමතරව අලුතින් නිල නිවාසයක ඉදි කිරීම් කටයුතු සිදුකර නිම කරන ලදී.



**ස්ථාපිත නව භෝජනාගාරය**

- නව වැසිකිළි පද්ධතියක ඉදිකිරීම් කටයුතු සිදු කරන ලද අතර කොන්ත්‍රාත්කරු ගේ ප්‍රමාද දෝෂයක් හේතුවෙන් එහි වැඩකටයුතු අතරමග නැවතින. 2016 වසර අවසන් වන විට එහි 25% ක වැඩ අවසන් වී තිබූ අතර 2017 වසරේදී ඉතිරි වැඩ සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමකින් පසු ඉදි කිරීම් කටයුතු අවසන් කිරීමට නියමිතය.

- නරඹන්නන් ගේ භාවිතය සඳහා නව භෝජනාගාරයක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කරන ලදී.

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 139,600 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.

- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඇතුළත් පත්‍රිකා, පුවරු සකස් කරන ලදී.

- උද්‍යානයේ තත්ත්වය ඉහළ මට්ටමකට නගාසිටුවීම සඳහා භූමි සංවර්ධන කටයුතු සහ සෙසු නඩත්තු කටයුතු ද සිදු කරන ලදී.



**අලුතින් ඉදිවුන නිල නිවාසය**

- උද්‍යානයේ ඉහළ කොටසේ මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ගල් ඇතිරීමේ කටයුතු සිදුකරන ලදී.

## 5.4. ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය

<u>මූල්‍ය ප්‍රගතිය</u>

**අනුමත ප්‍රතිපාදන: ප්‍රාග්ධන දීමනා වලින් රු. මි. 10.95ක්**
**උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 3 ක්**

**වැය : රු.මි. 13.759**



**උද්‍යානයේ අලුතින් ඉදිවුනු ගිම්හාන කුටිය**

<u>භෞතික ප්‍රගතිය</u>

උද්‍යානයේ බාහිර පෙනුම වැඩිදියුණු කරමින් ගොඩනැගිලි සහ අනෙකුත් ව්‍යුහයන් හි නඩත්තු කටයුතු සිදුකිරීම තුළින් උද්‍යානය උසස් තත්ත්වයකින් පවත්වා ගැනීමට කටයුතු සිදුකරන ලදී.

- ප්‍රදේශයේ මල්වගාව ප්‍රචලිත කිරීමේ අරමුණින් ඇන්තූරියම් හා ඕකිඩ් වගා අංශ ස්ථාපිත කිරීමේ කටයුතු සිදුකර අවසන් කර ප්‍රදේශයේ මල්වගාව ව්‍යාප්ත කිරීමට කටයුතු ආරම්භ කරන ලදී.
- රෝපණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැළ 48,000 කට අධික ප්‍රමාණයක් නිපදවන ලදී. ශාක එකතුව වැඩි දියුණු කිරීම සඳහා ඉරිවේරිය, දැත්ත, ශාක ඇතුළත් ශාක අංශ ඇති කරන ලදී. මීට අමතරව වෙනත් මව් ශාක එකතුවක් ස්ථාපනයට ද කටයුතු සිදුවෙමින් පවතී.
- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත



**ප්‍රදේශයේ මල්වගාව ප්‍රචලිත කිරීමේ අරමුණින් ස්ථාපිත ඇන්තූරියම් හා ඕකිඩ් වගා අංශ**



**ශාක එකතුව වැඩි දියුණු කිරීම් කටයුතු**

කිරීම සඳහා තොරතුරු ඇතුළත් පත්‍රිකා, පුවරු සකසන ලදී.

- උද්‍යානයේ ගිම්හාන කුටියක් අලුතින් ඉදි කෙරිණි.
- උද්‍යානයේ වාහන රථගාල අලුත්වැඩියා කරන ලද අතර ශාකාගාර කොටස නවීකරණය කරන ලදී.
- දේශීය ඖෂධීය අගයන්ගෙන් යුත් ආහාර පාන අලෙවිය සඳහා ආපනශාලාවක් ඉදි කිරීමේ කටයුතු අවසන් කෙරිණි. ඒ අසල නව වැසිකිළි 02ක ඉදි කිරීම් කටයුතු සැලසුම් කරන ලදී.



උද්‍යානයේ අලුතින් ස්ථාපිත දේශීය ඖෂධ අගයන්ගෙන් යුත් ආහාර පාන සහිත ආපනශාලාව

- උද්‍යානය තුළ පානීය ජල පද්ධතියක් ස්ථාපනය ආරම්භ කරන ලද අතර ඒ සඳහා ළිඳක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කරන ලදී.
- ඖෂධ ශාක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ පුද්ගලයින් 2,273 දෙනෙකු ඖෂධ ශාක භාවිතය, ඒවායෙහි වටිනාකම සහ සංරක්ෂණය පිළිබඳ දේශන පවත්වා දැනුවත් කරන ලදී.

## 5.5 ශාකාගාරය සහ ශාක වර්ගීකරණ හා ශාක හඳුනා ගැනීමේ පර්යේෂණ

<u>මූල්‍ය ප්‍රගතිය</u>

| | |
|---|---|
| **අනුමත ප්‍රතිපාදන:** | **උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රුපියල් මි. 5 ක්** |
| වැය | **: රු.මි. 4.714** |




ශාකාගාර තාක්ෂණික ක්‍රම හා කළමනාකරණය පිළිබඳ පවත්වන ලද වැඩමුළුවක්

<u>භෞතික ප්‍රගතිය</u>

- ජෛව විවිධත්වය සංරක්ෂණය සහ ශාකාගාර තාක්ෂණික ක්‍රම හා කළමනාකරණය පිළිබඳ වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

34 ක් පාසැල් සිසුන් 316 ක්, විශ්වවිද්‍යාලයීය සිසුන් 589 ක් ද, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ නිලධාරීන් 199 ක් සඳහා පවත්වන ලදී. මෙහිදී ශාකාගාර තාක්ෂණික ක්‍රම හා ශාකාගාර කළමනාකරණය, ශාක වර්ගීකරණය හා ශාක හඳුනාගැනීම මෙන්ම ජෛව විවිධත්වය සහ ජෛව විවිධත්ව සංරක්ෂණයෙහි වැදගත්කම, ජාතික රතු දත්ත ලැයිස්තුව සෑදීමේදී ජාතික ශාකාගාරයේ දායකත්වය පිළිබඳ දැනුවත් කෙරිණි.




**ප්‍රකාශයට පත් කරන ලද ජෛව විවිධත්වය සම්බන්ධ පෝස්ටරයක්**


- මහනුවර, කෑගල්ල හා මාතලේ දිස්ත්‍රික්කයන්හි උසස් පෙළ පාසල් ළමුන් 291 සඳහා ජෛව විවිධත්වය සහ ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රමවේද පිළිබඳ ප්‍රායෝගික වැඩසටහන් ද ඇතුළත්ව එක්දින වැඩමුළු 06 ක් පවත්වන ලදී.
- උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ප්‍රධාන වශයෙන් වියළි සහ තෙත් කලාපීය තර්ජනයට ලක්වූ ශාක ඉලක්ක කරගනිමින් ශාක ගවේෂණ කටයුතු මෙම වසරේ දී ද සිදු කරන ලදී. මීට අමතරව ඉහළ කඳුකර ප්‍රදේශයේ ශාක ගවේෂණ කටයුතු ශ්‍රී පාද කඳු පන්තිය ආශ්‍රිතව සිදු කරන ලදී.



**අවුරුදු 128කට පසු මීමුරේ ප්‍රදේශයෙන් සොයා ගත් වඳ වී ගොස් ඇති ශාකයක් ලෙස 2012 රතු දත්ත පොතෙහි සඳහන් *Rinorea decora***

- උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර ගවේෂණ 21 ක් සිදු කරන ලද අතර සජීවී සපුෂ්ප ශාක නිදර්ශක 810 ක්, මීවන ශාක නිදර්ශක 54 ක් සහ පාසි ශාක නිදර්ශක 195 ක් එකතු කෙරිණි.
- මෙම ශාක නිදර්ශක අතුරින් තර්ජනයට ලක්වූ ශාක හඳුනාගැනීම සිදුකළ අතර, වඳ වී ගිය ශාක කාණ්ඩයේ එක් ශාක විශේෂයක්ද, දැඩි ලෙස වඳ වී යාමේ අවදානමට ලක්වූ ශාක 6 ක්ද, වඳ වී යාමේ අවදානමට ලක්වූ ශාක 53 ක් ද, අනාගතයේ දී වඳ වී යාමේ

අවදානමට ලක්විය හැකි ශාක 78 ක්ද, තර්ජනයට ලක්වීමට ආසන්න ශාක 53 ක් ද, වඳ වී යාමේ අවදානමක් නොමැති ශාක විශේෂ 208 ද ප්‍රමාණවත් ලෙස දත්ත වාර්තා වී නොමැති කාණ්ඩයේ ශාක 02 ක්ද හඳුනා ගන්නා ලදී. ශාක විතැන් සංරක්ෂණ ක්‍රමවේද යොදා ගනිමින් අවශ්‍ය අවස්ථා වලදී ශාක සංරක්ෂණ කටයුතු ද සිදු කරන ලද අතර රැස් කර ගන්නා ලද සපුෂ්ප ශාක නිදර්ශක 1188 ක් මීවන ශාක නිදර්ශක 212 හා පාසි ශාක නිදර්ශක 175 ක් ජාතික ශාකාගාරයේ අනාගත විමර්ශන කටයුතු සඳහා තැන්පත් කරන ලදී.




**"Wild Flowers of Sri Lanka" ග්‍රන්ථය**

- මෙම උද්භිද විද්‍යාත්මක ශාක ගවේෂණ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර ගවේෂණ සිදු කිරීමේ දී අවුරුදු 128කට පසු මීමුරේ ප්‍රදේශයෙන් සොයා ගත්, 2012 රතු දත්ත පොතෙහි වඳ වී ගොස් ඇති ශාකයක් ලෙස සඳහන් *Rinorea decora* ශාකය වාර්තා වුනු අතර විතැන් සංරක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය ශාක කොටස් පේරාදෙණියේ රාජකීය උද්භිද උද්‍යානය වෙත ගෙන එනු ලැබීය.

- විශ්වවිද්‍යාල පර්යේෂණ, ආයුර්වේද පර්යේෂණ, වාණිජ කර්මාන්ත, අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සඳහා සහ ශාකාගාරයේ තැන්පත් කිරීම සඳහා සපුෂ්ප ශාක නිදර්ශක 1812 ක්, මීවන ශාක නිදර්ශක 218 ක් සහ පාසි ශාක නිදර්ශක 130 ක් හඳුනා ගන්නා ලදී.

- මහේස්ත්‍රාත් උසාවි, පොලිසි හා රේගු දෙපාර්තමේන්තුව මඟින් යොමු කරන ලද නඩු විභාග 33 කට අයත් සාම්පල් 249 ක් අදාල නීතිමය කටයුතු සඳහා හඳුනා ගන්නා ලදී.

- මධ්‍යම කඳුකරයෙන් රැස් කර ගන්නා ලද තලස ශාක විශේෂ 15 ක් පමණ රාජකීය උද්භිද උද්‍යානය තුළ රෝපණය කර විතැන් සංරක්ෂණය කරන ලද අතර පර්යේෂණාගාර තුළ දී අදාල රෝපණ තත්ත්ව ලබා දී ප්‍රරෝහණය කර නඩත්තු කරගෙන යමින් පවතී.

- "Wild Flowers of Sri Lanka" යන ග්‍රන්ථ සංග්‍රහය ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ග්‍රන්ථයෙහි ඡායරූප සහිත නිදර්ශක 250ක විද්‍යාත්මක තොරතුරු/ පොදු නාම, සංරක්ෂණ තත්ත්වයන්, වාසස්ථාන අඩංගුය. මෙම ග්‍රන්ථයෙහි තොරතුරු සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් යුක්තය.

- “Common Wayside Trees of Sri Lanka” යන ග්‍රන්ථ සංග්‍රහය හි සංස්කරණ කටයුතු කරගෙන යමින් පවතී. එහි ඡායාරූප සහිත නිදර්ශක 100 ක විද්‍යාත්මක තොරතුරු/ පොදු නාම, සංරක්ෂණ තත්ත්වයන්, වාසස්ථානද අඩංගුය. මෙම ග්‍රන්ථ තොරතුරු දෙමළ සහ සිංහල භාෂාවන්ගෙන් යුක්ත වේ.

- ශ්‍රී ලංකාවේ තර්ජනයට ලක්වූ ශාක, ආක්‍රමණික ශාක, ජෛව විවිධත්වය, ශ්‍රී ලංකාවේ වන මල්, ශ්‍රී ලංකාවේ විසිතුරු ඕකිඩ් පිළිබද අත් පත්‍රිකා හා පෝස්ටර් මුද්‍රණය කර ප්‍රකාශයට පත් කරන ලදී.

- ජාතික ශාකාගාරයේ තැන්පත් රූප සටහන් සහ නිදර්ශක සංඛ්‍යාව නිර්ණයට සහ අධ්‍යයනය පහසු කිරීමේ අරමුණින් එම නිදර්ශක වලට ප්‍රවේශ අංකයන් (Accession number) ලබා දී ඒවා දත්ත පද්ධතියකට ඇතුළත් කිරීමේ කටයුතු සිදු කෙරිණි.

- ජාතික ශාකාගාරයේ නවීකරණ කටයුතු සිදුකළ අතර පරීක්ෂණාගාර නවීකරණය, පැරණි ශාකාගාර ගොඩනැගිල්ලේ ජලය අපවහන වන නල අලුත්වැඩියාව, නව ශාකාගාරයේ තැන්පත් කර ඇති නිදර්ශකවල තත්ත්වය ආරක්ෂාකර ගැනීමට නිදර්ශක තැන්පත් කර ඇති ප්‍රදේශයෙහි වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීම සිදුකරන ලදී.

## 5.6. ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන

**<u>මූල්‍ය ප්‍රගතිය</u>**

| | |
|---|---|
| **අනුමත ප්‍රතිපාදන:** | **උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 23** |
| **වැය** | **: රු.මි. 23** |

**<u>භෞතික ප්‍රගතිය</u>**

පහළ සහ මධ්‍යම ප්‍රමාණයේ මල්වගාකරුවන් සවිබල ගැන්වීම සහ ඔවුන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමට මල්වගා සංවර්ධන වැඩසටහන මෙම වසරේදී ද ක්‍රියාත්මක කරන ලදී.



**වගාකරුවන් සදහා පැවැත්වූ පුහුණු වැඩමුළුවක්**

- දිවයින පුරා මල්වගා ව්‍යාප්තිය සඳහා මල්වගා ගොවි සංගම් ප්‍රමාණය 173 දක්වා වැඩි කරමින් මෙම වර්ෂයේ දී නව ගොවි සංගම් 11 ක් පිහිටුවන ලදී. ඇන්තූරියම්, ඕකිඩ්, රෝස, ජර්බෙරා, කැපූ පත්‍ර සහ පටක රෝපණය ඇතුළුව අනෙකුත් මල්වගාව සම්බන්ධ ක්ෂේත්‍රයන් පිළිබඳව

පුද්ගලයින් 24,972 ක් පුහුණු කර ඇත. මීට අමතරව පාසල් සිසුන්ගේ මල්වගාව සම්බන්ධ ව්‍යාපෘති 67 ක් සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ලබා දී ඇත.

- මල්වගා කරුවන්ගේ කාර්මික සහ සෙසු නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු 19 ක් පවත්වන ලද අතර වගා කරුවන් 966 ක් දෙනෙකු පුහුණු කරන ලදී.

- මල්වගා කරුවන්ගේ මල් වගාවන් අලෙවිකරණය ඉහළ නැංවීම සඳහා සුළු පරිමාණ ප්‍රදර්ශන 387 ක් සහ දිස්ත්‍රික් මට්ටමේ විශාල ප්‍රදර්ශන 3 ක් පවත්වන ලදී. මල්වගා කරුවන්ගේ පැළ තවාන් 1471 කට ගොස් සහ මල්වගා සමිති රැස්වීම් 538 කට සහභාගී වී ක්ෂේත්‍ර ගැටළු සඳහා උපදෙස් ලබාදෙන ලදී.



මල්වගා අලෙවිකරණය ඉහළ නැංවීම සඳහා පවත්වන ලද සුළු පරිමාණ ප්‍රදර්ශනයක්

- ක්ෂේත්‍රයේ දී සහ රසායනාගාර පහසුකම් යටතේ ඕකිඩ් දෙමුහුන් වර්ග සහ ඇන්තූරියම් වර්ග කීහිපයක් සකසනු ලැබිණි.

- සියලුම උද්‍යානයන් හි මල්වගා අංශ වල පැළ තවාන් උසස් මට්ටමකින් නඩත්තු කළ අතර වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය මිලදී ගැනීම් සිදු කරන ලදී. පේරාදෙණිය උද්‍යානයෙහි පැළ ගෘහයෙහි තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.



මල් වගා කරුවන්ගේ පැළ තවාන් වලට ගොස් ක්ෂේත්‍ර ගැටළු සඳහා උපදෙස් ලබාදෙමින්

- නාරාහේන්පිට පිහිටි සහකාර අධ්‍යක්ෂ කාර්යාලය මල්වගා ක්ෂේත්‍රය සහ ශාක සම්බන්ධ තොරතුරු කොළඹ ප්‍රදේශයේ ජනතාවට ලබාදීම සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීමේ කටයුතු

සිදුකෙරුනු අතර ඒ සඳහා ශ්‍රවණාගාරයක් ස්ථාපිත කරන ලදී. එහි දී මල්වගා ක්ෂේත්‍රය, ශාක සම්බන්ධ උපදේශන කටයුතු සිදුකිරීම, පුහුණු පන්ති පැවැත්වීම වැනි මල්වගා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට සහ සංවර්ධනයට අදාල කටයුතු සිදු කරනු ලබයි.



**නාරාහේන්පිට පිහිටි සහකාර අධ්‍යක්ෂ කාර්යාලයෙහි ස්ථාපිත කරන ලද ශ්‍රවණාගාරය**

- රටෙහි මල්වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා වර්තමාන හා අනාගත ක්ෂේත්‍ර අවශ්‍යතාවයන්ට සරිලන පර්යේෂණ කටයුතු සිදුකරන ලද අතර වර්තමානයේ වගාකරුවන් මුහුණ දෙන ගැටළු විසඳීම සඳහා පර්යේෂණ කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදි.

### 5.6.1. 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ

#### 5.6.1.1. Agronomy (වගා තාක්ෂණය) හා හෝමෝන,පොහොර අනුපාතයන්

- මාස 04 ක් 08ක් වයස ඇති ඩෙන්ඩ්‍රෝබියම් ඕකිඩ් වල වර්ධනය පොහොර හා හෝමෝන වල අනුපාතයන්ගේ බලපෑම පිළිබඳ පර්යේෂණ කරගෙන යනු ලැබීය.
- වැඩි වටිනාකමක් සහිත ඩ්‍රැසීනා,සැන්ඩ්‍රියානා අතු කොටස් ලබා ගැනීම සඳහා ඔක්සීන්, ගිබරලීක් ඇසිඩ් හා ආලෝකයේ බලපෑම පිළිබඳ පර්යේෂණය අවසන් කරන ලදී.
- ජර්බෙරා මල් වල උසස් තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා සිලිකන් වල බලපෑම අධ්‍යනය කරගෙන යනු ලැබිණි.
- බයෝෆිල්ම්- බයෝෆර්ටිලයිසර්/ Biofilm- BioFertilizer මල්වගාව සඳහා සුදුසු දැයි පරීක්ෂා කිරීම ආරම්භ කරන ලදී.
- අලින්ගේ අපද්‍රව්‍ය (අලිබෙටි) හා කොළ දිරා යෑම ඉක්මන් කිරීම සඳහා (Biofilm-BioFertilizer මඟින්) වූ පරීක්ෂණය අවසන් කරන ලදී.
- ඇන්තුරියම් හා විසිතුරු පත්‍රික ශාක වර්ධන සඳහා අලින්ගේ පොහොර යෙදීමේ සුදුසුභාවය පිළිබඳව මූලික අධ්‍යනයක් කරන ලදී.

### 5.6.1.2. Physiology (ශාක කායික විද්‍යාව)

- අග ඉවත් කරන ලද පිලෝඩෙන්ඩ්‍රන් ශාක වල අලුතින් අතු හට ගැනීම සඳහා හෝමෝන භාවිතය පිළිබඳව පර්යේෂණය අවසන් කරන ලදී.
- අග ඉවත් කරන ලද කොර්ඩිලයින් ශාක වල අතු බෙදීම හා දික්වීම සඳහා හෝමෝන වල බලපෑම පිළිබඳ පර්යේෂණ අවසන් කරන ලදී.

### 5.6.1.3. පටක රෝපණය

- ත්වරලා ශාකයේ පටක රෝපණය කිරීම හා ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වයට සිදුවන බලපෑම පිළිබඳ පර්යේෂණ අවසන් කරන ලදී.
- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් අලුතින් නිපදවා ඇති ඇන්තූරියම් වර්ග සඳහා නිවැරදි පටක රෝපණ ක්‍රම පිළිබඳ පර්යේෂණ කරගෙන යන ලදී.
- විවිධ මාධ්‍ය (Gelling agent) ඩෙන්ඩ්‍රෝබියම් හා වැන්ඩා යන ඕකිඩ් වර්ග වලට සිදුවන බලපෑම අධ්‍යයනය කරන ලදී.
- විවිධ මාධ්‍ය (Gelling agent) හා (Media additives) මඟින් ජර්බෙරා වර්ග දෙකකට වන බලපෑම අධ්‍යයනය කරන ලදී.
- ඩෙන්ඩ්‍රෝබියම්, ඕකිඩ් හා ජර්බෙරා වර්ග 02ක් සඳහා වර්ධන මාධ්‍යයට භාවිතා කරන ද්‍රව්‍ය වල යෙදවුම් පිළිබඳ අධ්‍යයනය කිරීම කරන ලදී.
- සංරක්ෂණ කටයුතු හා මල්වගාව සඳහා යොදා ගත හැකි ශාක (*Chirita sp*, *Hopea modesta*, *Tabebia serratifolia*) වර්ධනය සඳහා පටක රෝපණ තාක්ෂණය භාවිතා කිරීමේ පර්යේෂණ කරගෙන යන ලදී.

### 5.6.1.4. පසු අස්වනු තාක්ෂණය

- සමන්පිච්ච මල් පොහොට්ටු දිගුකාලයක් තුල ප්‍රවාහනයට සුදුසු ඇසුරුම් සොයාගැනීමේ පරීක්ෂණ කර අවසන් කරන ලදී.
- සමන්පිච්ච මල් සුවඳ ආරක්ෂා වන පරිදි වියලීම සඳහා අදාල පර්යේෂණ ආරම්භ කරන ලදී.
- මල් වල වර්ණය වෙනස් නොවන ලෙස මල් වියළීමේ පර්යේෂණ කටයුතු ආරම්භ කරන ලදී.

## 5.7. අධ්‍යාපනය සහ පුහුණුව

<u>මූල්‍ය ප්‍රගතිය</u>

| | |
|---|---|
| **අනුමත ප්‍රතිපාදන:** | **ප්‍රාග්ධන දීමනා වලින් රු. මි. 0.2 ක් උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 1** |
| **වැය** | **: රු.මි. 1.105** |



**NVQ- level 4 පාඨමාලාව හදාරන සිසුන් පිරිසක්**

<u>භෞතික ප්‍රගතිය</u>

පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පිහිටි අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කරන ලදී.

- නවීන මල් වගා ක්‍රමවේද හා භූ අලංකරණ ක්‍රමවේද පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව හරහා තරුණයින් 52 කු පුහුණු කරන ලදී.
- භූ දර්ශණ සංවර්ධන සහකාර ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය - මට්ටම 4 (NVQ- level 4) ලබා දෙන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම් සිදුකරන ලද අතර 19 දෙනෙකු ලියාපදිංචි වී පාඨමාලාව හදාරමින් සිටියි.
- රෝස වගාව, තවාන් කළමනාකරණය, ශාක හඳුනාගැනීම, ශාක ශල්‍යකර්මයන්, මල් සැකසුම්, පශ්චාත් අස්වනු තාක්ෂණය, භූමි අලංකරණය සහ සෙසු ආශ්‍රිත විෂයයන් පිළිබඳව පුද්ගලයින් 13,394 ක් පුහුණු කරන ලදී. මීට අමතරව ජෛව විවිධත්වය හා එහි සංරක්ෂණය පිළිබඳ පාසල් සිසුන් ඇතුළුව පුද්ගලයින් 1,292 ක් දැනුවත් කරන ලදී.

## 5.8. මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය

<u>මූල්‍ය ප්‍රගතිය</u>

| | |
|---|---|
| **අනුමත ප්‍රතිපාදන : රුපියල් මිලියන 5** | |
| වැය | **:රු. මිලියන 4.996** |


<u>භෞතික ප්‍රගතිය</u>

- ක්ෂේත්‍ර කාර්යාල ගොඩනැගිල්ල අංක. 04 හි අලුත්වැඩියා කටයුතු සිදුකිරීම වයඹ ඉංජිනේරු කාර්යාලය මගින් සිදු කෙරිණි. පළමු අදියර නිමකර ඇති අතර 2වන අදියරෙහි අලුත්වැඩියා කටයුතු ආරම්භ කර සිදුකරමින් පවතී.
- පැළ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර පැළ 38,316 ප්‍රමාණයක් නිපදවන ලදී.
- මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානයෙහි පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය කාර්යාලීය උපකරණ හා උද්‍යාන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා යන්ත්‍රෝපකරණ මිළදී ගන්නා ලදී.

## 5.9. මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට

<u>මූල්‍ය ප්‍රගතිය</u>

| | |
|---|---|
| **අනුමත ප්‍රතිපාදන: රුපියල් මිලියන 98.5 උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි. 2** | |
| වැය | **: රුපියල් මිලියන 100.257** |



**උද්‍යානයේ ස්ථාපිත නව ශාක සංරක්ෂණාගාරය**

<u>භෞතික ප්‍රගතිය</u>

උද්භිද උද්‍යානයේ යටිතල හා මහජන පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කෙරුණි.

- මහජනතාව තුළ විශේෂයෙන් වියළි කලාපීය ශාක පිළිබඳ දැනුම වර්ධනය, එම ශාක ජනතාවට සමීප කිරීම සහ සංරක්ෂණය අරමුණු

කරගනිමින් සෙවන ලැදි ශාක සහ දුර්ලභ ශාක මහජන ප්‍රදර්ශනය සඳහා පැළ සංරක්ෂණාගාරයක් ස්ථාපනය කරන ලදී.



නරඹන්නන් ගේ භාවිතය සඳහා උද්‍යානයේ අලුතින් ඉදිවූ නව භෝජනාගාරය

- පතොක් ශාකවල විවිධත්වය ප්‍රදර්ශනය සහ පතොක් ශාක පිළිබඳ නරඹන්නන් ගේ දැනුම වර්ධනය සඳහා එළිමහන් පතොක් ශාක සංරක්ෂණාගාරයක් ඉදි කරන ලදී.
- තාක්ෂණික නිලධාරීන් හා කණිෂ්ඨ අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා " කාර්ය මණ්ඩල උපයෝගිතා ගොඩනැගිල්ලක් " සියලුම පහසුකම් සහිතව ඉදි කරන ලදී. මේ සඳහා උපදේශන සේවා සපයනු ලැබුවේ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යංශය යි.



උද්‍යානයේ ස්ථාපිත නව පතොක් ශාක සංරක්ෂණාගාරය

- දැනට පවතින කාර්ය මණ්ඩලීය නිල නිවාස 02 ට අමතරව අලුතින් නිල නිවාස 02 ක ඉදිකිරීම් කටයුතු සිදු කෙරිණි.



ඉදි කෙරුණු කාර්ය මණ්ඩල උපයෝගිතා ගොඩනැගිල්ල

- උද්‍යානයේ සහ ප්‍රදේශයේ මල්වගා සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින් මල්වගා කටයුතු සඳහා පරීක්ෂණාගාරයක් ඉදිකරන ලදී. ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ මෙවලම් ද මිලදී ගන්නා ලද අතර පරීක්ෂණ කටයුතු

සිදුවෙමින් පවතී.

- නරඹන්නන් ගේ භාවිතය සඳහා නව භෝජනාගාරයක් ස්ථාපිත කරන ලදී.

- උද්‍යානයේ ඇතැම් කොටස් වල බාහිර පෙනුම සහ මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ඉන්ටර්ලොක් ගල් ඇතිරීමෙන් උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග වැඩිදියුණු කරන ලද අතර ප්‍රධාන මාර්ග සමහරක ගල් අතුරා කාපට් කරන ලදී.

- උද්‍යානයට නරඹන්නන් ගේ පැමිණීම වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් උද්‍යානයේ ඉදිරි පස ඇතුල්වීමේ ප්‍රවේශයට අමතරව තිස්ස - කතරගම මාර්ගයට මුහුණ ලා නව ප්‍රවේශ පත්‍ර කවුළුවක් ඉදි කරන ලද අතර මහජනතාව සඳහා විවෘත කර ඇත.

- උද්‍යානය වටා ආරක්ෂිත වැට ස්ථාපනය කිරීම් කටයුතු සිදු කරන ලදී.



**තිස්ස - කතරගම මාර්ගයට මුහුණ ලා ඉදි වූ නව ප්‍රවේශපත්‍ර දොරටුව**

- උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා අලංකාර ශාක සහිත මල් උයන්, අඩිපාරවල්, මාවත් සහ අනෙකුත් උද්‍යාන අංශ වැඩිදියුණු කරමින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු ද සිදු කරන ලදී.

- ප්‍රදේශයේ මල් වගාකරුවන් හට පහසුකම් සැපයීම සඳහා උද්‍යානයේ මල් වගා සංවර්ධන කටයුතු වැඩිදියුණු කර ඇත. උද්‍යානයේ සජීවී ශාක එකතුව වැඩිදියුණු කර ඇති අතර මල් වගා ව්‍යාප්ති කාර්යාලයේ පහසුකම් වැඩිදියුණු කර ඇත. ප්‍රදේශයේ මල් වගාකරුවන් දිරිගැන්වීම සහ ධාරිතා වර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම, වැඩමුළු හා පුහුණු සැසි ද පවත්වන ලදී.

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 30,850 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.

- දැනට උද්‍යානය තුළ උද්‍යානය නැරඹීමේ පහසුව සඳහා නරඹන්නන් වෙනුවෙන් යොදවා ඇති බැටරි බලයෙන් ක්‍රියාත්මක වන රථ 4 ට අමතරව තව එක් රථයක් මිළදී ගෙන සේවයේ යොදවන ලදී.

## 5.10. සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල

<u>මූල්‍ය ප්‍රගතිය</u>

**අනුමත ප්‍රතිපාදන : ප්‍රාග්ධන දීමනා වලින් රු. මි. 25 ක් සහ උද්භිද උද්‍යාන භාරකාර අරමුදලෙන් රු.මි.5**

**වැය : රු.මි. 29.68**




**ස්ථාපිත කරන ලද ජපන් උයන**

<u>භෞතික ප්‍රගතිය</u>

උද්‍යානයේ නරඹන්නන් සඳහා පහසුකම් උද්‍යානය තුළ ඇතිකිරීම, නඩත්තු කටයුතු ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම සහ උද්‍යානය තුළ නව පහසුකම් ඇති කිරීම සඳහා විවිධ සංවර්ධන කටයුතු සිදු කරන ලදී.

- වනෝද්‍යානයේ සුන්දර වටපිටාව මැදින් උද්‍යානයේ ඉහළ ප්‍රදේශය නැරඹීමට යන අතරමඟ නැරඹුම් ස්ථානයක් ඉදිකර නිම කරන ලදී. මෙම නැරඹුම් ස්ථානයේ සිට බලන විට මුළු උද්‍යානයේ ම දර්ශනීය දසුනක් නරඹන්නන්ට දැකගැනීමට හැකි වේ.
- උද්‍යානයට අලුතින් අත්පත් කරගත් ප්‍රදේශයෙහි ස්ථාපිත පැරණි ගොඩනැගිලි 02ක් නිල නිවාස ලෙස සංවර්ධනය කිරීමේ කටයුතු සිදුකරන ලදී.



**උද්‍යනයේ ඉදිකර නිමකරන ලද නැරඹුම් වේදිකාව**

- උද්‍යානයේ මාර්ග වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ඉන්ටර්ලොක් ඇතිරීමේ කටයුතු සිදුකරන ලදී.



ඉදි වෙමින් පවතින ගිම්හාන කුටියක්

- උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා ජපන් උයනක් ස්ථාපිත කරන ලදී. ගිම්හාන කුටි 02 ක ඉදි කිරීම් කටයුතු සිදුකරමින් පවතින අතර ඉදි කිරීම් කටයුතු වලින් 95 % ක වැඩ දැනට අවසන් වී ඇත. 2017 වසරේ දී සියලු ඉදි කිරීම් කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වේ.
- නරඹන්නන්ගේ භාවිතය සඳහා නව භෝජනාගාරයක් ඉදිකරන ලදී.
- උද්‍යානය තුළ පානීය ජල පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතු සිදුකල අතර ජල ටැංකියක් ද ස්ථාපනය කර ඇත.



නරඹන්නන් ගේ භාවිතය සඳහා ස්ථාපිත භෝජනාගාරය

- උද්‍යානය වටා ආරක්ෂිත වැට ස්ථාපනය කිරීම් කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගන්නා ලද අතර එහි වැඩ කටයුතු අවසන් කර ඇත.
- උද්‍යානයේ භූ දර්ශනීය ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා අලංකාර ශාක සහිත මල් උයන්, අඩිපාරවල්, මාවත් සහ අනෙකුත් උද්‍යාන අංග වැඩිදියුණු කරමින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු ද සිදු කරන ලදී.
- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කරමින් ශාක එකතුව ශක්තිමත් කරමින් ශාක සංරක්ෂණ කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ නිෂ්පාදන කටයුතු සිදු කරන ලද අතර 71,085 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.

- නරඹන්නන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ඇතුළත් පත්‍රිකා, පුවරු සකස් කර ප්‍රදර්ශනයට තබා ඇත.



උද්‍යානය තුළ ස්ථාපිත තොරතුරු මධ්‍යස්ථානය

සියලුම උද්‍යානයන් හි කාර්යක්ෂම කළමනාකරණය සඳහා අවශ්‍ය නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ උද්‍යාන මෙවලම් යනාදිය මිලදීගත් අතර පවතින යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ද වැඩිදියුණු කිරීම තුළින් උද්‍යාන අලංකාරය උසස් මට්ටමකින් පවත්වාගෙන යන ලදී.

# 6. දෙපාර්තමේන්තුව යටතේ සෙසු ඒකකවල කළමනාකරණය

## 6.1. අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාස

අතිගරු ජනාධිපතිතුමාගේ කොළඹ 01 පිහිටි ජනාධිපති මන්දිරය, මහනුවර, නුවරඑළිය, අනුරාධපුරයේ සහ ගරු අගමැතිතුමාගේ කොළඹ අරලියගහ මන්දිරය සහ නුවරඑළියේ පිහිටි නිල නිවාසබද උද්‍යාන උසස් ලෙස නඩත්තු කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාසබද උද්‍යානවල අලංකරණය සහ සැලසුම් කළ පරිදි තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන කටයුතු දියත් කෙරිණි.

## 6.2 අනුරාධපුර ශ්‍රී මහා බෝධිය

ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්ත්වය සොයා බැලීමේ කටයුතු සඳහා පියවර ගැනිම මෙන්ම බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය තත්ත්වය පවත්වාගෙන යාමේ කටයුතු සඳහා මෙම වසරේදී පියවර ගන්නා ලදී.

## 6.3. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්ඒකක

මහනුවර, ජාවත්ත, බොරැල්ල සහ ත්‍රිකුණාමලය යන ස්ථානයන් හි පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක වල නඩත්තු කටයුතු හා කළමනාකරණ කටයුතු ඉහළ මට්ටමක පවත්වාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු සිදුකරන ලදී.



**ජාවත්ත හි පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන**

## 6.4. උද්භිද උද්‍යාන භාර අරමුදල

උද්භිද උද්‍යාන සංවර්ධනය සහ සුහසාධනය සඳහා වු උද්භිද උද්‍යානභාර අරමුදල 1996 පෙබරවාරි 07 දින කැබිනට් අනුමැතියෙන් ආරම්භ කරන ලද්දේ 1995 දෙසැම්බර් 15 වැනි දින කෘෂිකර්ම, ඉඩම් සහ වන සම්පත් ඇමති වෙත ඉදිරිපත් කරන ලද කැබිනට් සටහන් පත්‍රිකාව සැලකිල්ලට ගනිමිනි.

උද්භිද උද්‍යානවල වාර්ෂික ආදායමෙන් 25% උද්භිද උද්‍යානය වැඩිදියුණු කිරීම සහ එහි සුහසාධනය සඳහා උද්‍යාන භාරකාර අරමුදල වෙත වෙන් කිරීමක් වන අතර මෙය මෙම අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වේ. උද්භිද උද්‍යානවල සංවර්ධන කටයුතු සඳහා මුල්‍යමය ආධාර සැපයීම මෙම අරමුදලේ ප්‍රධාන අරමුණ වන අතර අනෙකුත් අරමුණු පහත පරිදි වේ.

- උද්භිද උද්‍යාන ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශ රටවල ද ප්‍රවර්ධනය කිරීම.
- අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ පැළෑටි සංරක්ෂණය කිරීම.
- උද්‍යානයන්හි පහසුකම් වැඩිදියුණු කිරීම සහ උපකරණ මිළදී ගැනිම සඳහා මුල්‍යමය ආධාර සැපයිම.
- උද්භිද උද්‍යානවල සංවර්ධනය මෙන්ම තාක්ෂණික, අධ්‍යාපනික සහ පුහුණු ක්‍රියාදාමයන් වැඩිදියුණු කිරීම සඳහා මුල්‍යමය ආධාර සැපයීම.
- උද්භිද උද්‍යානයට පැමිණෙන විද්‍යාඥයින් සහ විශේෂ නියෝජිතයින් සඳහා පහසුකම් සැපයීම සඳහා කඩිනම් ඉදිකිරීම් හෝ නඩත්තු කටයුතු සිදු කිරීම.
- සැලසුම් කරන ලද විශේෂ වු වැඩසටහනකට අවශ්‍ය පුනරාවර්තන වැය ආවරණය කිරීම.

උද්‍යාන භාරකාර අරමුදලේ මුල්‍යමය සහාය යටතේ 2016 වර්ෂයේදී උද්‍යානවල සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලද අතර එය උද්‍යානවල තත්ත්වය ඉහළ මට්ටමක පවත්වා ගැනීමට විශාල දායකත්වයක් සපයන ලදී .

2016 වර්ෂය සඳහා උද්‍යානභාරකාර අරමුදලේ වාර්ෂික ප්‍රාග්ධන වෙන්කිරීම් රුපියල් මිලියන 140 ක් වූ අතර උද්භිද උද්‍යාන සංවර්ධනය සඳහා එයින් රුපියල් මිලියන 139.9 (100%) වැය කර ඇත.

# 7. 2016 වර්ෂය තුළ සිදු කරන ලද බඳවා ගැනීම්, ස්ථාන මාරු, විශ්‍රාම ගැනීම් හා වෙනත් කටයුතු

## 7.1 බඳවා ගැනීම් - ගැසට් නිවේදන මගින්

| තනතුර | පැවති පුරප්පාඩු ගණන | බඳවාගත් ප්‍රමාණය |
|---|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 |
| තොරතුරු හා සන්නිවේදන සහකාර | 2 | 1 |
| උද්‍යාන වැඩමූලික | 2 | 1 |
| සහාය බංගලා භාරකරු | 4 | 4 |
| ගාස්තු අය කිරීමේ සහකාර | 18 | 18 |
| පර්යේෂණ උපසහකාර | 2 | 1 |
| උද්‍යාන සුළු පරිපාලක | 14 | 9 |
| ලොරි පවිත්‍රකරු | 2 | 2 |
| ලේබල්කරු | 1 | 1 |
| **එකතුව** | **46** | **38** |

## 7.2. 2016 වර්ෂය තුළ විශ්‍රාම ගැනීම් සහ මියගිය පුද්ගලයින්

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| උද්‍යාන සංවර්ධන සහකාර | 01 |
| කළමනාකරණ සහකාර | 03 |
| කම්කරු | 10 |
| මුරකරු | 02 |
| ගබඩාකරු | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| රියදුරු | 01 |
| **එකතුව** | **20** |

## 7.3. 2016 වර්ෂය තුළ ස්ථානමාරු

| තනතුර | දෙපාර්තමේන්තුවෙන් පිටතට ගිය ගණන | දෙපාර්තමේන්තුවට පැමිණි ගණන |
|---|---|---|
| කළමනාකරණ සහකාර සේවය | 03 | 07 |
| සංවර්ධන නිලධාරී | - | 05 |
| ගාස්තු අය කිරිමේ සහකාර * | 03 | - |
| කාර්යාල සේවක සේවය | 03 | 01 |
| රියදුරු | - | 03 |
| උද්‍යාන වැඩ මූලික* | 01 | - |
| මුරකරු* | 02 | - |
| කම්කරු* | 01 | - |
| **එකතුව** | **13** | **16** |

*** උසස්වීම් මත මාරුවීම් ලබා ඇත.**

## 7.4. අභ්‍යන්තර උසස්වීම් මත තනතුරින් ඉවත් වීම්

| පෙර තනතුර | පසු තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 |
| ගස් නඩත්තුකරු | උද්‍යාන සුළු පරිපාලක | 2 |
| තවාන්කරු | උද්‍යාන සුළු පරිපාලක | 1 |
| පර්යේෂණ උපසහකාර | උද්‍යාන සුළු පරිපාලක | 1 |
| කම්කරු | උද්‍යාන සුළු පරිපාලක | 5 |
| කම්කරු | පර්යේෂණ උප සහකාර | 1 |
| කම්කරු | ගාස්තු අයකිරීමේ සහකාර | 2 |
| මුරකරු | ගාස්තු අයකිරීමේ සහකාර | 1 |
| ලේබල්කරු | ගාස්තු අයකිරීමේ සහකාර | 1 |

## 8. කාර්ය මණ්ඩල පුහුණුව සහ හැකියාව ගොඩනැංවීම

### 8.1. කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් (විදේශීය)

| අංකය | වැඩසටහන | රට | කාල සීමාව | විදේශගත වූ නිලධාරීන් |
|---|---|---|---|---|
| 1. | සංයුක්ත ශාක වර්ගීකරණය හා හඳුනාගැනීම සහ ක්ෂේත්‍ර ගවේෂණ නිපුණතා පිළිබඳ පාඨමාලාව | එංගලන්තය | 2016 වර්ෂයේ සැප්තැම්බර් 12-23 | නදීකා ගුණවර්ධන මිය කාර්ය භාර නිලධාරි ජාතික ශාකාගාරය |
| 2. | උද්භිද උද්‍යාන සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | චීනය | 2016 වර්ෂයේ සැප්තැම්බර් 08 - ඔක්තෝබර් 07 | අචලා අත්තනායක මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය හා එම්.එම්.ඩී.ජේ. සේනාරත්න මහතා සහකාර අධ්‍යක්ෂ ගම්පහ උද්භිද උද්‍යානය |
| 3. | ගෝලීය භූ විද්‍යාත්මක වැදගත් වූ ප්‍රදේශ /උද්‍යාන කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | මැලේසියාව | 2016 වර්ෂයේ මැයි 16 -21 | එම්.සී.වික්‍රමසිංහ මහත්මිය සහකාර අධ්‍යක්ෂ ගම්පහ උද්භිද උද්‍යානය |

### 8.2 කාර්ය මණ්ඩල සඳහා පැවැත්වූ දෙපාර්තමේන්තුමය පුහුණු වැඩසටහන් (දේශීය)

| අංකය | වැඩසටහන | දිනය | පැවැත්වූ ස්ථානය | ඉලක්කගත කණ්ඩායම |
|---|---|---|---|---|
| 1. | ආකල්ප වර්ධන පුහුණු වැඩසටහන | 2016.01.25 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය | උද්‍යාන කණිෂ්ඨ සේවක මහත්ම මහත්මීන් |
| 2. | කළමනාකරණ දක්ෂතා වර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | 2016.09.26 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය | රා.ක.ස.නිලධාරීන් හා ඒකක ප්‍රධානීන් |
| 3. | සුළු පරිපාලක නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 2016.10.11 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය | සුළු පරිපාලක නිලධාරීන් 12 |
| 4. | කාර්යාලයීය කළමනාකරණ පුහුණු වැඩසටහන | 2016.11.24<br>2016.11.25 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය | රා.ක.ස.නිලධාරීන් හා ඒකක ප්‍රධානීන් |
| 5. | සංගීත රසාස්වාදන වැඩසටහන | 2016.11.25 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය | සියලුම නිලධාරී මහත්ම මහත්මීන් |
| 6. | රියදුරු පුහුණු වැඩසටහන | 2016.12.09 | අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය | රියදුරු මහතුන් |

## 8.3. කාර්ය මණ්ඩල නිලධාරීන් බාහිර ආයතන වෙතින් ලද පුහුණු (දේශීය)

| අංකය | වැඩසටහන | දිනය | සහභාගී වූ ගණන | සේවා ගණය |
|---|---|---|---|---|
| 1. | ආකල්ප හා හැකියා වර්ධන පුහුණු වැඩසටහන | 2016.02.03 | 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවය |
| 2. | රාජ්‍ය ලේඛන කළමනාකරණ සහ සංරක්ෂණය පිළිබඳ එක්දින වැඩමුළුව | 2016.03.17 | 01 | සංවර්ධන නිලධාරි |
| 3. | නිවාඩු ලිපිකරුවන්ගේ කාර්ය භාරය | 2016.05.16 | 01 | කළමනාකරණ සහකාර සේවය |
| 4. | ව්‍යාපෘති සම්පාදනය හා සැලසුම් කිරීම | 2016.06.16<br>2016.06.17<br>2016.06.20 | 02 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය |
| 5. | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2016.07.04 | 02 | කළමනාකරණ සහකාර සේවය |

# 9. 2017 වර්ෂය සඳහා අනාගත සැලැස්ම

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රු. මි.) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| **මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය** | | |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරන හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා අළුත්වැඩියා කටයුතු | 1.3 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක ප්‍රචාරණ කටයුතු සඳහා අවශ්‍ය විද්‍යාගාරයක් සහ බීජ කාමරයක් ස්ථාපිත කිරීම | 2 | ඒකාබද්ධ අරමුදල් |
| නව කාර්යාලය, කුඩා ශාකාගාරයක් , සාකච්ඡා කාමරයක්, පුස්තකාලයක් සමග නරඹන්නන් සඳහා මධ්‍යස්ථානයක් දකුණු දොරටුව අසල ඉදිකිරීම | 14 | ඒකාබද්ධ අරමුදල් |
| දකුණු දොරටුව අසල ගිම්හාන නිවාස 02 ක් ඉදිකිරීම | 5 | ඒකාබද්ධ අරමුදල් |
| මල්වගා ප්‍රදර්ශන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | 5 | ඒකාබද්ධ අරමුදල් |
| පිරිමින් හා කාන්තාවන් සඳහා තනිකඩ නිලනිවාස සංකීර්ණයක් පිහිටුවීම | 9 | ඒකාබද්ධ අරමුදල් |
| අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම | 10 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ රෝපණ වැඩසටහන හරහා ශාක එකතුන් වැඩිදියුණු කිරීම, ශාක විතැන් සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 4 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක නාම ලේබල්, විශේෂ ශාක පිළිබඳ විස්තරාත්මක ලේබල් සවි කිරීම | 1 | ඒකාබද්ධ අරමුදල් |

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රු. මි.) | අරමුදල් මූලාශ්‍රය |
| --- | --- | --- |
| ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු සහ අනෙකුත් නඩත්තු කටයුතු | 7 | ඒකාබද්ධ අරමුදල් |
| විධිමත් උද්‍යානය සංවර්ධනය | 6 | ඒකාබද්ධ අරමුදල් |
| දකුණු දොරටුව අසල රථගාල පිහිටුවීම | 5 | ඒකාබද්ධ අරමුදල් |
| නිලනිවාසය, කාර්ය මණ්ඩල උපයෝගිතා ගොඩනැගිල්ල ස්ථාපිතකර නිම කිරීම | 3 | ඒකාබද්ධ අරමුදල් |
| සෙවන ගෘහයක් පිහිටුවීම | 3 | ඒකාබද්ධ අරමුදල් |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **75.3** | |
| **ඉලුක්ඹිටිය තෙත් කලාපීය උද්භිද උද්‍යානය** | | |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා අළුත්වැඩියා කටයුතු | 1.7 | ඒකාබද්ධ අරමුදල් |
| කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම - 1වන අදියර | 5 | ඒකාබද්ධ අරමුදල් |
| නව වැසිකිළියක් ස්ථාපිත කිරීම | 2 | ඒකාබද්ධ අරමුදල් |
| බෝට්ටු අංගනයක් ඉදි කිරීම | 2 | උද්භිද උද්‍යාන භාරය |
| ගිම්හාන නිවාස 02ක් ස්ථාපිත කිරීම | 2 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ රෝපණ වැඩසටහන හා ශාක එකතුන් වැඩි දියුණු කිරීම, ශාක විතැන් සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 0.5 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක නාම ලේබල්, විශේෂ ශාක පිළිබඳ විස්තරාත්මක ලේබල් සවි කිරීම | 0.1 | ඒකාබද්ධ අරමුදල් |
| පානීය ජල පද්ධතියක් ස්ථාපනය කිරීම - 2වන අදියර | 0.4 | ඒකාබද්ධ අරමුදල් |
| ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු සහ අනෙකුත් නඩත්තු කටයුතු | 7.85 | ඒකාබද්ධ අරමුදල් |
| උද්‍යානයේ ආරක්ෂිත වැට ඉදිකිරීම | 4.5 | ඒකාබද්ධ අරමුදල් |
| සෙවන ගෘහයක් පිහිටුවීම | 1.5 | ඒකාබද්ධ අරමුදල් |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **27.55** | |
| **හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය, ගම්පහ** | | |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා අළුත්වැඩියා කටයුතු | 1.9 | ඒකාබද්ධ අරමුදල් |
| ක්ෂේත්‍ර කම්කරුවන් සඳහා සේවා ඒකකයක් පිහිටුවීම | 4 | ඒකාබද්ධ අරමුදල් |
| නව ගරාජයක් ඉදිකිරීම | 2 | ඒකාබද්ධ අරමුදල් |
| සූර්ය බල ශක්ති ඒකක ස්ථාපිත කිරීම | 1.5 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ රෝපණ වැඩසටහන හා ශාක එකතුන් වැඩි දියුණු කිරීම, ශාක විතැන් සංරක්ෂණ වැඩසටන් ක්‍රියාත්මක කිරීම | 1 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක නාම ලේබල්, විශේෂ ශාක පිලිබඳ විස්තරාත්මක ලේබල් සවි කිරීම | 0.25 | ඒකාබද්ධ අරමුදල් |
| අභ්‍යාන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම | 1 | ඒකාබද්ධ අරමුදල් |
| ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු සහ අනෙකුත් නඩත්තු කටයුතු | 2.5 | ඒකාබද්ධ අරමුදල් |

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රු. මි.) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| ජල සැපයීම් පද්ධතිය යාවත්කාලීන කිරීම | 0.5 | ඒකාබද්ධ අරමුදල් |
| ඕකිඩ් නිවාසය ස්ථාපිතකර නිම කිරීම | 5 | උද්භිද උද්‍යාන භාරය |
| උද්‍යානයේ ආරක්ෂිත වැට පිළිසකර කර නිමකිරීම | 3 | උද්භිද උද්‍යාන භාරය |
| අත්තනගලු ඔය හි ඉවුර සංරක්ෂණය | 7 | උද්භිද උද්‍යාන භාරය |
| ගොඩනැගිලි සහ විවිධ ආකෘතීන්ගේ අළුත්වැඩියා කටයුතු | 3 | උද්භිද උද්‍යාන භාරය |
| උද්‍යානයේ මල් ආකෘති සැකසීම | 2 | උද්භිද උද්‍යාන භාරය |
| ශාක පිළිබඳ තොරතුරු මහජනතාවට ලබා දීම | 0.5 | උද්භිද උද්‍යාන භාරය |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **35.15** | |
| **ගනේවත්ත වන ඖෂධ උද්‍යානය** | | |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 0.6 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ නිෂ්පාදනය සඳහා සෙවන ගෘහයක් ඉදිකිරීම | 0.7 | ඒකාබද්ධ අරමුදල් |
| නරඹන්නන් සඳහා පානීය ජල කරාම හා බංකු ස්ථාපිත කිරීම | 0.5 | ඒකාබද්ධ අරමුදල් |
| වැහි ජලය එක්රැස් කරන ස්ථාන ඇතිකිරීම | 0.4 | ඒකාබද්ධ අරමුදල් |
| සූර්ය බල ශක්ති ඒකක ස්ථාපිත කිරීම | 1.5 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ ගෘහය ස්ථාපිත කිරීම | 2.3 | ඒකාබද්ධ අරමුදල් |
| උද්‍යාන සේවකයින් සඳහා ක්ෂේත්‍ර කාර්යාලයක් ඉදි කිරීම | 1.5 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක පිළිබඳ තොරතුරු මහජනතාවට ලබා දීම | 0.3 | උද්භිද උද්‍යාන භාරය |
| ශාකාගාර කටයුතු සංවර්ධනය | 0.8 | උද්භිද උද්‍යාන භාරය |
| පැළ රෝපණ වැඩසටහන හා ශාක එකතුන් වැඩි දියුණු කිරීම, ශාක විතැන් සංරක්ෂණ වැඩසටන් ක්‍රියාත්මක කිරීම | 1 | ඒකාබද්ධ අරමුදල් |
| ශාක නාම ලේබල්, විශේෂ ශාක පිළිබඳ විස්තරාත්මක ලේබල්, නාම පුවරු සවි කිරීම | 0.25 | ඒකාබද්ධ අරමුදල් |
| ඉඩම් වැඩිදියුණු කිරීම්, ඖෂධ වගාව පුළුල් කිරීම් කටයුතු සහ අනෙකුත් නඩත්තු කටයුතු | 1.75 | ඒකාබද්ධ අරමුදල් |
| ජලජ ශාක එකතුවක් ස්ථාපිත කිරීම සඳහා පොකුණු 02ක් සෑදීම | 0.75 | ඒකාබද්ධ අරමුදල් |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **12.35** | |
| **හක්ගල උද්භිද උද්‍යානය** | | |
| ගොඩනැගිලි, නිලනිවාස, යන්ත්‍රෝපකරණ සහ වාහන අළුත්වැඩියා කටයුතු | 0.6 | ඒකාබද්ධ අරමුදල් |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 0.4 | ඒකාබද්ධ අරමුදල් |
| වැසිකිළි පද්ධති සඳහා පල්දොරු වලක් ඉදිකිරීම | 1 | ඒකාබද්ධ අරමුදල් |
| වැසිකිළි 2ක කටයුතු නිම කිරීම | 2 | ඒකාබද්ධ අරමුදල් |

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රු. මි.) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| උද්‍යානයේ ආරක්ෂිත වැට ඉදිකිරීම | 3 | උද්භිද උද්‍යාන භාරය |
| නිලනිවාස  ඉදිකිරීම | 9 | උද්භිද උද්‍යාන භාරය |
| අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම | 5 | උද්භිද උද්‍යාන භාරය |
| කසළ කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම | 2 | උද්භිද උද්‍යාන භාරය |
| පැළ රෝපණ වැඩසටහන හා ශාක එකතුන්  වැඩි දියුණු කිරීම , ශාක විතැන් සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 1 | උද්භිද උද්‍යාන භාරය |
| ශාක නාම ලේබල්, විශේෂ ශාක පිලිබඳ විස්තරාත්මක ලේබල්, නාම පුවරු සවි කිරීම | 0.5 | උද්භිද උද්‍යාන භාරය |
| ශාක පිළිබඳ තොරතුරු මහජනතාවට ලබා දීම | 1 | උද්භිද උද්‍යාන භාරය |
| ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු සහ අනෙකුත් නඩත්තු කටයුතු | 12.5 | උද්භිද උද්‍යාන භාරය |
| රථගාලක් ඉදිකිරීම | 7 | උද්භිද උද්‍යාන භාරය |
| උද්‍යානයට ඇතුළුවීමේ ගේට්ටුවක් ඉදිකිරීම | 3 | උද්භිද උද්‍යාන භාරය |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **48** | |
| **පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය** | | |
| ගොඩනැගිළි, නිලනිවාස, යන්ත්‍රෝපකරණ සහ වාහන අළුත්වැඩියා කටයුතු | 6.8 | ඒකාබද්ධ අරමුදල් |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 1.5 | ඒකාබද්ධ අරමුදල්/ උද්භිද උද්‍යාන භාරය |
| ස්ථාපිත පැළ ගෘහයෙහි අභ්‍යන්තර ශාක සැලැස්ම ස්ථාපිත කිරීම | 1.5 | උද්භිද උද්‍යාන භාරය |
| මා ඔය ජල සැපයීම් පද්ධතිය යාවත්කාලීන කිරීම | 2 | උද්භිද උද්‍යාන භාරය |
| අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම | 4 | උද්භිද උද්‍යාන භාරය |
| උද්‍යානයේ ජීව වායු ඒකකයක් සමඟ කසළ කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම | 2.5 | ඒකාබද්ධ අරමුදල් |
| කැෆටේරියා හි ජල අපවහන පද්ධතියක් ස්ථාපිත කිරීම | 3 | උද්භිද උද්‍යාන භාරය |
| ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු සහ අනෙකුත් නඩත්තු කටයුතු | 5 | උද්භිද උද්‍යාන භාරය |
| පැළ රෝපණ වැඩසටහන හා ශාක එකතුන්  වැඩි දියුණු කිරීම , ශාක විතැන් සංරක්ෂණ වැඩසටන් ක්‍රියාත්මක කිරීම | 1.175 | උද්භිද උද්‍යාන භාරය |
| ශාක නාම ලේබල්, විශේෂ ශාක පිලිබඳ විස්තරාත්මක ලේබල්, නාම පුවරු සවි කිරීම | 1 | උද්භිද උද්‍යාන භාරය |
| ශාක පිළිබඳ තොරතුරු මහජනතාවට ලබා දීම | 1 | උද්භිද උද්‍යාන භාරය |
| නිලනිවාසය ස්ථාපිතකර නිම කිරීම | 6 | උද්භිද උද්‍යාන භාරය |
| රථගාලක් ඉදිකිරීම | 1 | උද්භිද උද්‍යාන භාරය |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **36.475** | |

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රු. මි.) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| **අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානය** | | |
| භූ අලංකරණ ක්‍රමවේද පිළිබඳව ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වීම | 0.25 | උද්භිද උද්‍යාන භාරය |
| භූ දර්ශණ සංවර්ධන සහකාර ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය - මට්ටම 4 (NVQ- level 4) ලබා දෙන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම | 0.25 | උද්භිද උද්‍යාන භාරය |
| මධ්‍යස්ථානයේ ජලඅපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම | 2.5 | උද්භිද උද්‍යාන භාරය |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **3** | |
| **මල් වගා සංවර්ධන වැඩසටහන** | | |
| පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සහ මල් වගා සංවර්ධන අංශයේ පර්යේෂණාගාර වල විවිධ නඩත්තු කටයුතු | 8 | ඒකාබද්ධ අරමුදල් |
| මල්වගාව සම්බන්ධව අත් පත්‍රිකා, පුවත් පත්‍රිකා ප්‍රකාශයට පත්කිරීම | 1 | උද්භිද උද්‍යාන භාරය |
| වගා කරුවන්ගේ හැකියා ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවත්වීම | 2 | උද්භිද උද්‍යාන භාරය |
| මල් ප්‍රදර්ශන/ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම | 1 | උද්භිද උද්‍යාන භාරය |
| රැස්වීම් වලට සහභාගී වීම සහ පැළ තවාන් කළමනාකරණය සඳහා පැළ තවාන් වල සංචාරය සහ උපදෙස් සැපයීම සහ වගා කරුවන් සඳහා සෙසු සහාය ලබාදීම | 2 | ඒකාබද්ධ අරමුදල් |
| ද්‍රව්‍ය සැපයීම මගින් වගා කරුවන්ට සහාය ලබා දීම | 10 | උද්භිද උද්‍යාන භාරය |
| පැළ තවාන් සහ වැව්ලි ප්‍රදේශ දියුණු කිරීම | 5.5 | උද්භිද උද්‍යාන භාරය |
| පැළ විකිණීම සහ සිටුවීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම | 3 | උද්භිද උද්‍යාන භාරය |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **32.5** | |
| **ජාතික ශාකාගාරය** | | |
| පර්යේෂණ ක්‍රියාකාරකම්, ශාක ගවේෂණ කටයුතු සිදු කිරීම | 2 | උද්භිද උද්‍යාන භාරය |
| ජාතික ශාකාගාරයේ නිදර්ශක එකතුන් යාවත්කාලීන කිරීම හා විවිධ නඩත්තු කටයුතු | 4 | උද්භිද උද්‍යාන භාරය |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **6** | |
| **මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය** | | |
| භූමියේ ඇති පැරණි ගොඩනැගිලි අළුත්වැඩියාව | 3 | ඒකාබද්ධ අරමුදල් |
| නව ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 0.5 | ඒකාබද්ධ අරමුදල් |
| පැළ තවාන් සහ වැව්ලි ප්‍රදේශ දියුණු කිරීම | 1.5 | ඒකාබද්ධ අරමුදල් |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **5** | |

| ව්‍යාපෘති නාමය | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රු. මි.) | අරමුදල් මූලාශ්‍රය |
|---|---|---|
| **ප්‍රධාන කාර්යාලය** | | |
| ප්‍රධාන කාර්යාලයේ පහසුකම් වැඩිදියුණු කිරීම | 10.725 | උද්භිද උද්‍යාන භාරය |
| පුහුණු වැඩසටහන් | 7.5 | උද්භිද උද්‍යාන භාරය/ ඒකාබද්ධ අරමුදල් |
| ගොඩනැගිලි, නිලනිවාස, යන්ත්‍රෝපකරණ සහ වාහන අළුත්වැඩියා කටයුතු | 0.4 | ඒකාබද්ධ අරමුදල් |
| නව ආම්පන්න, කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 0.1 | ඒකාබද්ධ අරමුදල් |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **18.725** | |
| **අවශ්‍ය මුලු ප්‍රතිපාදන** | **300.05** | |